හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# වාර්ෂික වාර්තාව
# 2008

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ - 07.

# පටුන


| | පිටු අංක |
|---|---|
| වාර්ෂික වාර්තාව 2008 | 1-3 |
| පාලක මණ්ඩලය | 3 |
| කෘෂි ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය | 4-12 |
| පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය | 13-16 |
| අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය | 17-22 |
| මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය | 23-25 |
| සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය | 26-28 |
| 2008 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | 29 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 29-30 |
| ගිණුම් | 31-40 |
| විගණන වාර්තාව | 41-46 |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ - 07.
2009.05.28

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය
"ගොවිජන මන්දිරය",
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

අමාත්‍යතුමනි,

**2008 වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය පරිදි 2008 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වූ වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛන ආයතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් මේ සමග ඉදිරිපත් කරමි.

1. වාර්ෂික වාර්තාව
2. විගණනය කරන ලද ආදායම් හා වියදම් ගිණුම්
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණය

මෙයට - විශ්වාසී,

.......................................................
සභාපති
පාලක මණ්ඩලය

# වාර්ෂික වාර්තාව - 2008

1972 අංක 5 දරන "ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත" මගින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවන ලදී. එය කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි. ප්‍රතිපත්ති මූලික පර්යේෂණ සහ ගොවි හා ග්‍රාමීය අංශයේ පුහුණු අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ආයතනය මූලික ව පිහිටුවනු ලැබිණි. ආරම්භය වූ 1972 වසරේ සිට ගොවි කටයුතු පර්යේෂණයන් හි පුරෝගාමියකු ලෙස, සමාජ-ආර්ථික පර්යේෂණ සහ පුහුණු කටයුතු සිදු කිරීමෙන් ද, ගොවි කටයුතු අංශයේ සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමෙ හි ලා තොරතුරු සැපයීමෙන් ද, වසර 35 කට අධික වූ වටිනා අත්දැකීම් සම්භාරයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සතු ව ඇත.

## ව්‍යවස්ථාව

ඉහත සඳහන් පනතෙ හි, 3(1) වගන්තිය යටතේ වන විධිවිධාන අනුව, ආයතනයේ මූලික ව්‍යවස්ථාපිත අරමුණු පහත සඳහන් පරිදි වේ.

i. ගොවිජන පර්යේෂණයන් පෝෂණය කිරීම, දිරිදීම සහ සහයෝගය දැක්වීම.

ii. රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ආයතන මගින් බාර ගන්නා ගොවිජන පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.

iii. කෘෂිකර්ම සංවර්ධනයට බලපාන ආයතනික කරුණු පිළිබඳ විමර්ශනය කිරීම සහ පර්යේෂණ කිරීම.

iv. කෘෂිකාර්මික අරමුණු ඉටු කරගැනීම සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ඵලදායී ලෙස භාවිතා කිරීම පිළිබඳ විමර්ශන, පර්යේෂණ හා අධ්‍යයන කටයුතු කිරීම.

v. කෘෂිකාර්මික සහ ග්‍රාම සංවර්ධනයට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීම.

vi. දේශීය හෝ විදේශීය ආයතනයන්ගේ සහයෝගය ඇති ව හෝ තනි ව කෘෂිකාර්මික පර්යේෂණයන්ට සම්බන්ධ පුහුණු කිරීම් සහ වැඩසටහන් දියත් කිරීම, පහසුකම් සැපයීම මෙන් ම ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ විශිෂ්ට සම්මාන ප්‍රදානය කිරීම.

vii. දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර තලයේ සම්මන්ත්‍රණ, අධ්‍යයන කව, වැඩමුළු පැවැත්වීම සහ ඒ සඳහා අවශ්‍ය අනුග්‍රහය දැක්වීම.

viii. ආසියානු රටවල සහයෝගීතාවය මත කලාපීය අවශ්‍යතාවන් සඳහා ගොවිකටයුතු ව්‍යුහය තුළ පවතින ගැටලුවලට අදාළ පර්යේෂණ පැවැත්වීම, ගොවිකටයුතු ආශ්‍රිත ගැටලු පිළිබඳ කරුණු එක්රැස් කිරීමේ සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

ix. ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ආසියානු රටවල කෘෂිකර්ම සංවර්ධනය සහ නවීකරණය සම්බන්ධ ගැටලු ඉහත සඳහන් පර්යේෂණයන්ට අදාළ කරගැනීම.

## දැක්ම (Vision)

ගොවිජන සහ ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදාහැරීමේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර (Mission)

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම.

## අරමුණු

i. ගොවිජන ගැටලු සඳහා සමාජ-ආර්ථික පර්යේෂණ සිදු කරන විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.

ii. රජයේ සැලසුම් සකසන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, ව්‍යාපාරිකයන් සහ පර්යේෂණ ප්‍රජාවන් සමග සමීප සබඳතා ඇති කරගැනීම.

iii. දැනුම ජනනය කර කාලීන ව බෙදහැරීම තුළින් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම.

iv. ජාතික ප්‍රතිපත්ති ගැටලු සම්බන්ධයෙන් ස්වාධීන තක්සේරු/ඇගයීම් ලබාදෙමින් රාජ්‍ය අංශය දැනුවත් කිරීම.

v. ආයතනික කාර්ය මණ්ඩලයේ හැකියාවන් සහ ආයතනයේ දැනුම් පදනම පුළුල් කිරීම සඳහා ආයෝජනය කිරීම තුළින් සමාජ-ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම.

vi. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධනයට දයක වන පාර්ශවකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම.

## කාර්ය මණ්ඩලය

සේවකයන්ට ඔවුන්ගේ රාජකාරී කටයුතු තෘප්තිමත් ලෙස කරගෙන යාම සඳහා යෝග්‍ය පරිසරයක් ආයතනය තුළ නිර්මාණය කොට ඇත. විමසුමට ලක් කෙරෙන වසරේ වයස විශ්ලේෂණයට අනුව, පර්යේෂණ කාර්ය මණ්ඩලයේ මධ්‍යන්‍ය වයස අවුරුදු 46 මාස 2 ක් වූ අතර, සංඛ්‍යාන කාර්ය මණ්ඩලයේ මධ්‍යන්‍ය වයස අවුරුදු 47 ක් විය. 2008 දෙසැම්බර් 31 වන දිනට සේවකයන්ගේ වයස විශ්ලේෂණය සහ සේවා විශ්ලේෂණය පිළිවෙළින් වගු අංක 1 හි සහ වගු අංක 2 හි දක්වා ඇත.

**වගුව 1 : 2008 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ වයස විශ්ලේෂණය**

| වයස් කාණ්ඩය | කළමනාකරණ කාර්ය මණ්ඩලය | පර්යේෂණ කාර්ය මණ්ඩලය | සංඛ්‍යාන, දත්ත විශ්ලේෂණ කාර්ය මණ්ඩලය | ලිපිකාර හා සම්බන්ධිත | පහළ ශ්‍රේණී | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 60 වැඩි | 02 | - | - | - | - | 02 |
| 51-60 | 04 | 11 | 04 | 16 | 12 | 47 |
| 41-50 | 05 | 07 | 12 | 10 | 10 | 44 |
| 31-40 | 03 | 12 | 08 | 16 | 10 | 49 |
| 21-30 | - | - | - | 09 | 04 | 13 |
| 20 සහ ඊට අඩු | - | - | - | - | - | - |
| මුළු ගණන | 14 | 30 | 24 | 51 | 36 | 155 |

**වගුව 2 : 2008 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ සේවා විශ්ලේෂණය**

| සේවා කාලය (අවුරුදු) | කළමනාකරණ කාර්ය මණ්ඩලය | පර්යේෂණ කාර්ය මණ්ඩලය | සංඛ්‍යාන, දත්ත විශ්ලේෂණ කාර්ය මණ්ඩලය | ලිපිකාර හා සම්බන්ධිත | පහළ ශ්‍රේණී | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| 20 වැඩි | 03 | 10 | 09 | 16 | 17 | 55 |
| 16-20 | 03 | 05 | 03 | 03 | 03 | 17 |
| 11-15 | 01 | 03 | 08 | 08 | 03 | 23 |
| 06-10 | - | - | 04 | 12 | 02 | 18 |
| 5 ට අඩු | 07 | 12 | - | 12 | 11 | 42 |
| මුළු ගණන | 14 | 30 | 24 | 51 | 36 | 155 |

විමසුමට ලක් කෙරෙන වසර, ආයතනයේ ක්‍රියාකාරීත්වයේ වසර 36 ක් සම්පූර්ණ කරනු ලබයි. කෘෂිකාර්මික භෝග නිෂ්පාදනයේ වාර්තාගත ප්‍රගතියක් සනිටුහන් කරමින් මෙම වසර තුළ රජයේ නව කෘෂි හා ආහාර නිෂ්පාදන ප්‍රතිපත්තිය වූ "අපි වවමු - රට නගමු" වැඩසටහන ක්‍රියාත්මක විය. 2008 වර්ෂය තුළ දී, එළඹෙන ඉදිරි වසර පහ සඳහා ආයතනයේ සංයුක්ත සැලැස්ම සම්පාදනය කිරීමට ද හැකි විය. ආයතනය මගින් නිම කරන ලද ක්‍රියාකාරකම් පසු පිටු තුළ සම්පිණ්ඩනය කොට ඇත.

## පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| ජේ. රන්ජිත් විජේතිලක මහතා | - | ලේකම්, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය (2008 ඔක්තෝබර් සිට). |
| ටී.එම්. අබයවික්‍රම මහතා | - | ලේකම්, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය (2008 ජුනි දක්වා). |
| වී.කේ. නානායක්කාර මහතා | - | අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය. |
| ඩබ්.එම්. ජයතිලක මහතා | - | අතිරේක ලේකම් (ඉඩම්), කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය. |
| එම්.පී. හේවාවිතාරණ මහතා | - | සහකාර අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (2008 ජූලි සිට) |
| බිම්බා ගුණතිලක මහත්මිය | - | අධ්‍යක්ෂිකා, ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය. |
| පී.ඩී.ඩබ්. ජයවර්ධන මහතා | - | අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2008 ජුනි සිට) |
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2008 පෙබරවාරි දක්වා). |
| මාලිනී පීරිස් මහත්මිය | - | ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. |
| කමලා උයන්වත්ත මහත්මිය | - | අතිරේක ලේකම්, කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය (2008 පෙබරවාරි සිට). |
| ඩී.ඩී. වනිගනායක මහතා | - | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් (2008 මාර්තු දක්වා). |
| සැම් එදිරිසූරිය මහතා | - | අතිරේක ලේකම්, වෙළඳ, වාණිජ පාරිභෝගික කටයුතු සහ අලෙවි ප්‍රවර්ධන අමාත්‍යාංශය. |
| එන්.කේ.පී.කේ. නෙම්මාවත්ත මහතා | - | අධ්‍යක්ෂ, වෙළෙඳ, තීරුබදු සහ ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව, (2008 මැයි දක්වා). |
| රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා | - | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, (2008 අප්‍රේල් සිට). |
| කේ.එල්. ද සිල්වා මහතා | - | ජ්‍යෙෂ්ඨ ආර්ථික විශේෂඥ, ශ්‍රී ලංකා මහ බැංකුව. |
| මහාචාර්ය බුද්ධි මාරඹේ | - | පීඨාධිපති, කෘෂිවිද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. |
| ආචාර්ය සී. කුඩාගමගේ | - | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. |
| එස්.ඩී.ඒ.බී. බොරලැස්ස මහතා | - | ඉඩම් කොමසාරිස් ජෙනරාල්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව. |
| එම්.පී.එස්. සෝමසිරි මහතා | - | වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව (2008 ජනවාරි සිට). |
| ඒ.පී.පී. කිත්සිරි මහතා | - | සමූපකාර සංවර්ධන කොමසාරිස් ජෙනරාල්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. |
| වසන්ත ඒකනායක මහතා | - | අතිරේක ලේකම්, (මහවැලි සහ අපනයන කෘෂිකර්මය), කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය (2008 ජනවාරි දක්වා). |
| පෝටේ වුම්ශ්‍රී මහතා | - | නේවාසික නියෝජිත, ආහාර හා කෘෂිකර්ම සංවිධානය. |
| ආර්.ද සිල්වා මහත්මිය | - | ලේකම්, පාලක මණ්ඩලය සහ ලේඛකාධිකාරිණී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය. |

## කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

**අවසන් කළ අධ්‍යයන**

**1. ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයන්හි පවත්නා අවිධිමත් ඉඩම් ගනුදෙනු ක්‍රම සහ ඒවා නිෂ්පාදනය, ආයෝජනය හා ජානපදිකයන්ගේ ආදායම් කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය**

**සම්බන්ධීකාරක:** ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා

**අධ්‍යයනයේ අරමුණු:**

මෙහි ප්‍රධාන අරමුණු වූයේ, ජනපද ව්‍යාපාරයන් හි අවිධිමත් ඉඩම් ගනුදෙනු සඳහා බලපාන හේතූන් හා ඒවා ජනපද ව්‍යාපාරයන් හි නිෂ්පාදන හා ආයෝජන කටයුතු මෙන් ම ජානපදිකයන්ගේ ආදායම් හා අභිවෘද්ධිය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව විමසා බැලීම ය. අධ්‍යයනය සඳහා තොරතුරු රැස්කිරීම පරාක්‍රම සමුද්‍රය, මහවැලි එච් කලාපය, උඩවලව හා කිරිදි ඔය යන ජනපද ව්‍යාපාර ඇසුරින් සිදු කරනු ලැබිණි.

**මූලික සොයාගැනීම්:**

i. අවිධිමත් ඉඩම් භාවිතය ජනපද ව්‍යාපාරයන් හි ප්‍රචලිත සංසිද්ධියක් බව අනාවරණය විය. එය මඩ මෙන් ම ගොඩ ඉඩම්වලටත් පොදු වූ අතර, මඩ ඉඩම් සම්බන්ධයෙන් වැඩි ප්‍රවණතාවයක් පෙන්වන්නට විය. සාමාන්‍යයෙන් අධ්‍යයන ප්‍රදේශයෙ හි මඩ ඉඩම්වලින් සියයට හැටක් අවිධිමත් බුක්ති ක්‍රම යටතේ වූ අතර, මහවැලි එච් කලාපය වැනි ඇතැම් ව්‍යාපාරයන් හි එම ප්‍රමාණය සියයට 73 ක් පමණ දක්වා වැඩි විය.

ii. මඩ ඉඩම් හා සම්බන්ධ ප්‍රදේශයේ පැවති අවිධිමත් ඉඩම් භුක්ති ක්‍රමවල විවිධත්වයක් දැකිය හැකි වූ අතර, ඇතැම් භුක්ති ක්‍රම අවිධිමත් ලෙස ඉඩම් ගනුදෙනු කිරීම මත පදනම් විය. එවැනි අවිධිමත් භුක්ති ක්‍රම අතර, නිශ්චිත නිෂ්පාදන ප්‍රමාණයන් සඳහා බදු දීම (වී බදු), මුදල් පදනම මත බදු දීම සහ උකස් කිරීම වඩාත් ප්‍රචලිත විය. අනෙකුත් අවිධිමත් භුක්ති ක්‍රම එසේත් නැතිනම් ගනුදෙනු ක්‍රම වූයේ නීතිමය ලියවිලි නොමැතිව මිල දී ගැනීම හෝ විකිණීම, නිදහසේ වගාවට පවරා දීම, කැබලිවලට කැඩීම, හවුලේ බුක්ති විදීම, අනවසර ලෙස රජයේ හෝ පෞද්ගලික ඉඩම් භුක්ති විදීම යනාදිය යි.

iii. එක් එක් අවිධිමත් ඉඩම් භුක්ති ක්‍රම හෝ ගනුදෙනු ක්‍රම අතර විවිධත්වයක් තිබූ අතර, ප්‍රාදේශික ව ද වෙනස් විය. එම විවිධත්වය ඉඩම් කුළිය, වගාව සඳහා වූ අයිතිය හා අනෙකුත් කොන්දේසීන් හා රෙගුලාසීන් මත පදනම් විය. මෙවැනි අවිධිමත් ඉඩම් භුක්ති ක්‍රම ජල පහසුකම් ඇති නැති බව, වගා කළ හැකි බෝගවල ස්වභාවය සහ බෝග රටාව, යටිතල හා අලෙවි පහසුකම් මෙන් ම වෙනත් සමාජ ආර්ථික කරුණු මුල් කර ගත්තා වූ සුවිශේෂී පාරිසරික තත්ත්වයන් මගින් හැඩගස්වනු ලැබුවා වූ ඒවා ය.

iv. ඉඩම්, බදු ක්‍රමයට දීම සඳහා බලපානු ලැබූ ප්‍රධාන හේතූන් වූයේ, වගාව සඳහා පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් නො වීම, හදිසි කටයුතු සඳහා මුදල් අවශ්‍ය වීම, ප්‍රදේශයෙන් පිටත ජීවත් වීම සහ ඉඩම නඩත්තු කිරීමට ඇති නො හැකියාව යනා දී කාරණාවන් ය. ඉඩම් උකස් කිරීම සඳහා බලපෑ ප්‍රධාන කාරණය වූයේ, හදිසි කටයුතු

සඳහා මුදල් අවශ්‍ය වීම ය. පවුලේ ශ්‍රමය ප්‍රමාණවත් තරම් නො තිබීම, නිවැසියන්ගේ අලාභ පිරිමැසීම සඳහා මුදල් අවශ්‍ය වීම හා වර්තමානයෙ හි ඉඩම උකස් කර ඇති පුද්ගලයාගෙන් ලැබුණාට වඩා වැඩි මුදලකට එය නැවත උකස් කිරීමට අවශ්‍ය වීම යනාදිය ඒ සඳහා බලපෑ අනෙකුත් කරුණු විය.

v. අවිධිමත් ඉඩම් හා වගා කටයුතුවල නියැලී ගොවීන්ට ඔවුන්ගේ ඉඩම් සඳහා පැහැදිලි අයිතිය හෝ නිරවුල් ඔප්පු නොමැතිකම, විශේෂයෙන්ම කෙටිකාලීන භෝග සඳහා ආයෝජන කටයුතු වෙනුවෙන් ණය ලබා ගැනීම තවදුරටත් ගැටලුවක් වී ඇති බවක් නො පෙනිණි. එයට හේතු වූයේ, ඔවුන් ණය ලබාගැනීමේ දී කණ්ඩායම් ඇප පිළිගනු ලබන ගොවිජන බැංකුව, සමෘද්ධි බැංකුව, රජරට සංවර්ධන බැංකුව ආදී වූ ප්‍රාදේශීය සංවර්ධන බැංකු වැනි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මත යැපීම ය.

vi. අවිධිමත් ඉඩම් ගනුදෙනු යටතේ ඉඩම් අයිතිකරුවන් හා වගා කරන්නන් අතර පැවති සම්බන්ධතාවය ඉඩම් වල නිෂ්පාදන කටයුතු මෙන් ම දෙපාර්ශවයෙ හි ම සමාජ ජීවිතය කෙරෙහි අහිතකර ලෙස බලපානු නො ලැබිණි. එයට හේතු වූයේ, වැඩි ප්‍රමාණයක් අවිධිමත් ඉඩම් ගනුදෙනු සිදු ව තිබුණේ මිතුරන් හා නෑදෑයන් වැනි දෙපාර්ශවය ම කලින් සිට ම දැන හඳුනාගත් අය අතර වීම ය.

vii. වී වගාවෙ හි ඵලදායීත්වය සම්බන්ධයෙන් සලකා බලන විට මුදල් බදු, නිශ්චිත නිෂ්පාදන ප්‍රමාණයක් සඳහා බදු දීම හා උකස් කිරීම යනා දී වූ අවිධිමත් ක්‍රම යටතේ ලබාගත් ඵලදාව නීතිමය අයිතිය යටතේ වගා කළ ඉඩම්වලින් ලබාගත් ඵලදාවට වඩා ඉහළ මට්ටමක විය. ආදායම සම්බන්ධයෙන් ද තත්ත්වය ඒ හා සමාන විය.

viii. ජනපදයන් හි අවධිමත් ඉඩම් ගනුදෙනු, ඉහළ ඵලදාවක් හා ආදායමක් ලබාගැනීම සඳහා ඉඩම්, ජලය හා ශ්‍රමය වැනි නිෂ්පාදන සාධක ඉහළ තාක්ෂණය හා ඒකාබද්ධ කරමින් කෙසෙල් හා පැපොල් වැනි භෝග විවිධාංගීකරණයක් යටතේ වඩාත් ඵලදායී ව හා කාර්යක්ෂම ව භාවිතා කිරීම සඳහා දිරිගැන්විණි.

ix. ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් අවිධිමත් ඉඩම් භාවිතා කරන්නන්ගේ සාමාන්‍ය හැසිරීම වූයේ ගොවි සංවිධාන වල පූර්ව වගා රැස්වීම්වලට සහභාගී නොවීමත්, ඒවායේ තීරණ මෙන් ම ප්‍රදේශයේ වගා සැලැස්ම අනුගමනය නො කිරීමත් ය.

x. වර්තමානයේ දී සහනාධාර පොහොර ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර අනුමත කිරීම සම්බන්ධයෙන් දෙන ලද බලය යටතේ අවිධිමත් ඉඩම් වගාකරුවන්ට කන්න රැස්වීම්වල තීරණ මෙන් ම ගොවි සංවිධානවල තීරණ අනුගමනය කිරීම සඳහා බලකිරීමට ගොවි සංවිධානවලට හැකියාව ලැබී ඇත.

අධ්‍යයනය යටතේ කරනු ලැබූ නිර්දේශ නම් ජනපදවල අවිධිමත් ඉඩම් ගනුදෙනු විවිධ අංශයන්ගෙන් වඩාත් සාධනීය ලෙස ක්‍රියාවට නැගෙන නිසා ඒවා නීත්‍යානුකූල කිරීම, සියලු ම අවිධිමත් ඉඩම් ගනුදෙනුකරුවන් අදාළ ප්‍රදේශවල ගොවි සංවිධානයන් හි සාමාජිකයන් බවට පත් කිරීම සහ ඒවායේ නීතිරීතිවලට අනුව කටයුතු කිරීම අනිවාර්ය කිරීම යනාදිය යි.

## 2. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ කාර්යභාරය: වත්මන් තත්ත්වය සහ අනාගත විභවතාවන්

**පර්යේෂණ කණ්ඩායම:** එම්.ඩී. සුසිලා ලුරදු මහත්මිය - සම්බන්ධීකාරිකා
පී.ආර්. වීරක්කොඩි මහත්මිය - සම පර්යේෂිකා
ආර්.එන්..කේ. රඹුක්වැල්ල මහත්මිය - සම පර්යේෂිකා

**අධ්‍යයනයේ අරමුණු:**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන්ගේ කාර්යභාරය සහ එය ඉටු කිරීමේ දී පවතින සීමාවන් සහ විභවතාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම යි.

කුඩා පරිමාණ කෘෂිකාර්මික කටයුතු සඳහා වැඩි නැඹුරුවක් දක්වන දිස්ත්‍රික්ක හතක් මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු සපයාගැනීමට යොදා ගැනිණි. එම දිස්ත්‍රික්කයන් හි තෝරා ගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 21 ක සේවයේ නියුතු කෘ.ප.නි.ස.වරු 226ක් ප්‍රශ්නාවලී සමීක්ෂණය සඳහා සහභාගී වූහ.

**මූලික සොයාගැනීම්:**

i නියැදියෙන් බහුතරයකට බිම් මට්ටමේ සේවා සැපයීමට අදාළ පහසුකම් සපයන්නකු ලෙසින් කාර්යක්ෂම හා ඵලදායී ලෙස තම කාර්යසාධනය සඳහා ප්‍රමාණවත් අධ්‍යාපන සුදුසුකම් ඇත. නියැදියෙන් 96%ක් ම කෘ.ප.නි.ස. සේවාවට අදාළ වූ අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇත.

i නියැදියෙන් 24.3%ක් දිගුකාලීන පුහුණුවීම් සඳහා සහභාගී වීමේ අවස්ථාව ලබාගෙන ඇත. පුහුණුවීම් නො ලැබූ කෘ.ප.නි.ස.වරුන්ට වඩා පුහුණුලාභී කෘ.ප.නි.ස.වරුන්ගේ කාර්යසාධනය ඉහළ මට්ටමක් විද්‍යමාන කරයි.

iii ග්‍රාමීය සමාජයට අත්‍යවශ්‍ය නිලධාරියකු වීම කෘ.ප.නි.ස.වරුන්ගේ මූලික අභිප්‍රායකි. රැකියාව ආශ්‍රිත පත්වීමේ ස්වභාවය, අවම අධ්‍යාපන සුදුසුකම් සහ තනතුරු නාමය කෘ.ප.නි.ස.වරුන්හට ග්‍රාමීය කෘෂි සමාජය තුළ පිළිගැනීමට අඩු වීමට බලපාන සාධක වී ඇත.

iv කෘ.ප.නි.ස.වරුන්ගේ කාර්යභාරයේ දී වැඩි අවධානයක් යොමු වන්නේ, රජය විසින් දියත් කෙරුණු කාලීන වැඩසටහන් ඉටුකිරීමට ය. එහි දී ව්‍යාප්ති කාර්යය කෙරෙහි ඍජුව ම දායක නොවන අතර, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල දී ග්‍රාමීය මට්ටමේ සම්බන්ධීකාරකයකු ලෙස ක්‍රියාකාරී වේ.

v රාජකාරි 58 කින් යුත් කෘ.ප.නි.ස.වරුන්ගේ රාජකාරි ලැයිස්තුව සංකීර්ණත්වයකින් යුක්ත බැවින් කෘ.ප.නි.ස. සේවාවේ ස්වභාවය සහ වපසරිය අවිනිශ්චිත වී ඇති අතර, එම තත්ත්වය කෘ.ප.නි.ස.වරුන්ගේ කාර්යසාධනය ඇගයීමට ද බාධාවක් වී ඇත.

vi බොහෝ කරුණු සම්බන්ධයෙන් ස්ත්‍රී/පුරුෂ භාවය අනුව කැපී පෙනෙන විචලතාවන් ගම්‍ය නො වන මුත් ක්ෂේත්‍රයේ දී කෘ.ප.නි.ස.වරියෝ ප්‍රවාහන පහසුකම් අතින් දුෂ්කරතාවලට මුහුණ දෙති.

vii කෘ.ප.නි.ස.වරුන් බහුතරය (75%) රැකියාව පිළිබඳ මධ්‍යස්ථ මට්ටමේ තෘප්තියක් ලබන අතර, රැකියාව පිළිබඳ අභිප්‍රේරණය වී ඇති ප්‍රමාණයට වඩා රැකියාවෙන් අතෘප්තිමත් වී ඇති ප්‍රමාණය සාපේක්ෂ ව ඉහළ ය.

viii කෘ.ප.නි.ස.වරුන් කෘෂිකාර්මික පසුබිමක පීවත් වීමෙන් හා ග්‍රාමීය පරිසරය, ග්‍රාමීය සංවර්ධන විභවතා පිළිබඳ වඩාත් දැනුවත් පිරිසක් ලෙස ග්‍රාමීය කෘෂි සමාජයේ ප්‍රගමනය උදෙසා මනා කළමනාකාරිත්වයකින් හැසිරවිය හැකි හා ඊට උචිත මානව සම්පතකි.

කෘ.ප.නි.ස.වරුන්ගේ රාජකාරි ලැයිස්තුව සංශෝධනය කිරීමත්, සංශෝධිත රාජකාරි ලැයිස්තුව තුළ කාලීන හා ස්ථානීය රාජකාරි සඳහා ඉඩප්‍රස්ථා ඉතිරි කිරීමත්, ව්‍යාප්ති කාර්යභාරය පිළිබඳ ඇති අස්ථාවරත්වය නිරවුල් කිරීමත්, අනේවාසික පාඨමාලා ප්‍රදානය කිරීමෙන් හෝ එක් අවුරුදු ප්‍රායෝගික කෘෂිකර්ම පාඨමාලාව අනිවාර්ය කිරීමත්, විධිමත් ඇගයීම් ක්‍රමයක් හා උසස්වීම් පටිපාටියක් හඳුන්වා දීමත්, උචිත ස්ථාන මාරුවීම් ක්‍රමයක් හඳුන්වා දීමත් අධ්‍යයනය තුළින් නිර්දේශ කෙරේ.

## 3. කිරි ගම්මාන ව්‍යාපෘතිය මධ්‍යකාලීන ඇගයීම

**පර්යේෂණ කණ්ඩායම:** එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මහත්මිය - සම්බන්ධීකාරිකා
එස්. ඇපාසිංහ මහතා - සම පර්යේෂක

**අධ්‍යයනය සඳහා අරමුදල්:** පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**අධ්‍යයනයේ අරමුණ:**

කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ අරමුණු කොතෙක් දුරට ඉටු වී තිබේ ද යන්න විශ්ලේෂණය කිරීම සහ මෙම ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගනු ලැබූ ක්‍රමෝපායන් කොතෙක් දුරට ක්‍රියාත්මක කර ඇද්ද ඒවායේ බලපෑම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ ගැටලු මොනවාද යන්න සොයාබැලීමත්, මෙම කිරි ගම්මාන ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථක කරගැනීමට අදාළ ව ගත යුතු ක්‍රියාකාරකම් මොනවා ද යන්නත් නිර්දේශ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ පිහිට වූ කිරි ගම්මාන අධ්‍යයනය සඳහා තෝරා ගැනිණි. කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ 2004 හා 2005 වසරවල දී මෙවැනි ගම්මාන 30 කින් ගොවීන් 293 ක් තෝරා ගෙන ආකෘතිමය ප්‍රශ්නාවලියකින් සම්මුඛ පරීක්ෂණවලට යොමු කරන ලදී. ද්විතික මූලාශ්‍රවලින් ලද තොරතුරු ද අධ්‍යයනය සඳහා යොදා ගැනිණි.

**මූලික සොයා ගැනීම්:**

i. මෙම කිරි ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු අධ්‍යයන ප්‍රදේශය තුළ එළකිරි හා මී කිරි නිෂ්පාදනය ඉහළ නැංවී ඇත. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර එක් ගොවියකු දිනකට නිෂ්පාදනය කළ කිරි ප්‍රමාණය ලීටර් 16.01 සිට 19.9 දක්වා ඉහළ නැංවී ඇත. අධ්‍යයනය සිදු කළ දිස්ත්‍රික්ක 10 අතුරින් පුත්තලම දිස්ත්‍රික්කයේ දිනකට එක් ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසු ගොවියකු නිෂ්පාදනය කරන සාමාන්‍ය කිරි ප්‍රමාණය ලීටර් 18.6 සිට 31.6 දක්වා වැඩි වී ඇත. ව්‍යාපෘතියෙන් පසු මෙම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය කිරි නිෂ්පාදනය දෙගුණ වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ එම ප්‍රදේශයේ තත්ත්වයෙන් උසස් නිෂ්පාදන හැකියාවක් ඇති ගව සංහාරයක් දක්නට ලැබීම සහ සතුන් මනාව කළමනාකරණය කර, ගොවීන්ගේ කැපවීම තුළින් උපරිම නිෂ්පාදනයක් ලබාගැනීමට කටයුතු කිරීම යි. මෙයට අමතර ව පොදුවේ අධ්‍යයනය සිදු කළ අනෙකුත් සියලු ම දිස්ත්‍රික්කවල ව්‍යාපෘතියෙන් පසු කිරි නිෂ්පාදනය ඉහළ නැංවී ඇත. එම නිසා මෙම කිරි ගම්මාන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ සමස්ත කිරි නිෂ්පාදනය ඉහළ නංවන ඉතා වැදගත් ව්‍යාපෘතියක් වන අතර, මෙමගින් ග්‍රාමීය කුඩා පරිමාණ කිරි ගොවීන්ගේ ආර්ථික මට්ටම ද ඉහළ නංවයි.

ii. මෙම කිරි ගම්මාන ව්‍යාපෘතියේ තවත් වැදගත් අරමුණක් වූයේ, කිරි පාරිභෝජනය ඉහළ නැංවීම යි. අධ්‍යයනයට අනුව, කිරි ගොවීන්ගේ කිරි පාරිභෝජනය මෙම ව්‍යාපෘතිය නිසා ඉහළ නැංවී ඇති බවත් දක්නට නො ලැබිණි. එය ලීටර් 1.06 සිට 1.10 දක්වා වශයෙන් ඉතා මඳ වශයෙන් ඉහළ නැංවී ඇත. නමුත්

අධ්‍යයනයේ දී සමීක්ෂණයට ලක් කළ ගොවීන්ගෙන් 67.2%ත් අධ්‍යයනයට පෙර නැවුම් කිරි පාරිභෝජනය කර තිබූ අතර, එම ප්‍රමාණය අධ්‍යයනයට පසු 71.33% දක්වා වැඩි වී ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරි පරිභෝජනය ලීටර 0.21 සිට 1.09 දක්වා වැඩි වී තිබිණි. ගොවීන් වැඩි දෙනෙක් පැවසුවේ ගොවි පවුල් කිරි පාරිභෝජනයට යොමු වී නැත්තේ නැවුම් කිරි පාරිභෝජනය සෙම් තත්ත්වය වැනි රෝග ඇති කරන නිසා බව යි.

iii. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමෙන් අනතුරු ව ද ගොවීන් කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන සිදු කොට වටිනාකම් එකතු කිරීමට උනන්දු වී නැත.

iv. කිරි ගම්මාන ව්‍යාපෘතියේ දී කිරි නිෂ්පාදන ආශ්‍රිත ව විවිධ ස්වයං රැකියා අවස්ථා සඳහා ගොවීන් යොමු කිරීමට කටයුතු සැලසුම් කර තිබුණ ද අධ්‍යයනයට අනුව පෙනී ගියේ ඒ සඳහා ගොවීන් වැඩිපුර නැඹුරු වී නොමැති බව යි.

v. ව්‍යාපෘතියේ දී සැලසුම් කර තිබූ උපාය මාර්ග 18ක් අතුරින් 10 ක් පමණක් ක්‍රියාත්මක වී ඇති බව අනාවරණය වූ අතර, ඉදිරි ව්‍යාපෘතිවල දී එය ඉතා වැදගත් වනු ඇත.

vi. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගොවීන්ට ඇති ප්‍රධාන ගැටලුව වූයේ ඉතා ඉහළ නිෂ්පාදන ධාරිතාවක් ඇති හොඳ ආරයේ සතුන් ශ්‍රී ලංකාවේ විරල වීම යි. එම නිසා හොඳ ආරයේ ඉහළ නිෂ්පාදන ධාරිතාවක් ඇති සතුන් ගොවීන්ට සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ඉතා වැදගත් ය.

මෙම සොයාගැනීම් අනුව අධ්‍යයනයේ දී නිර්දේශ කරනු ලැබුයේ පෞද්ගලික අංශයේ අභිජනන මධ්‍යස්ථාන ඇති කර, ඉහළ නිෂ්පාදන ධාරිතාවක් ඇති සතුන් සුලභ කිරීමේ වැඩසටහනක් රාජ්‍ය මැදහත් වීම තුළින් සිදු කිරීම, කිරි ගොවි සමිතිවල ගොවීන් අදාළ නිලධාරීන් සමඟ මසකට වතාවක් රැස් වී ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කර, ග්‍රාමීය ව විසඳුම් සොයා ගැනීම, ණය යෝජනා ක්‍රම, නව ගොවීන් සම්බන්ධ කරගැනීම, නව තාක්ෂණය තරුණ පරපුරට ලබාදීම, විද්‍යුත් මාධ්‍ය මගින් නැවුම් කිරි භාවිතයේ වැදගත්කම අවබෝධ කරවීම, ජාතික ප්‍රාදේශීය මට්ටමින් පුහුණු පැවැත්වීම, නැවුම් කිරි භාවිතයෙන් මතුවන අසාත්මිකතා සඳහා ඖෂධ ප්‍රතිකර්ම සෙවීම සහ කිරි පාරිභෝජනය ඉහළ නැංවීම සඳහා ප්‍රචාරක වැඩකටයුතු තවදුරටත් පුළුල් කිරීම යි.

## 4. “ගමනැගුම” වැඩසටහන යටතේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මච්චාගම ගම්මානයේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාබද්ධ පර්යේෂණය

**පර්යේෂණ කණ්ඩායම:** ආර්.එල්.එන්. ජයතිස්ස මහතා - සම්බන්ධීකාරක
එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - සම පර්යේෂක

මෙය ශ්‍රී ලංකාවේ වියළි කලාපීය වැව් පදනම් කරගත් ගොවිජන සමාජයන් හි සමාජ - ආර්ථික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් වැඩිදියුණු කිරීම සඳහා "ගම නැගුම" ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන කාර්යයන් හි නියැළීමෙන් ඉගෙනුම් අද්දැකීමක් ලබාගැනීම සඳහා ක්‍රියාත්මක කළ ක්‍රියාබද්ධ පර්යේෂණයකි.

**අධ්‍යයනයේ අරමුණු:**

i. ගමේ පවත්නා සම්පත්වල භාවිතය වැඩි දියුණු කිරීමෙන් කෘෂි නිෂ්පාදනයේ ඵලදායීතාවය, ජනතාවගේ ආදායම් සහ රැකියා අවස්ථා වැඩි කිරීම.

ii. ඉහළ ඵලදායී ආර්ථික කටයුතු සඳහා ජනතාව සජීවීකරණය කිරීමේ වඩාත් හොඳ යාන්ත්‍රණයක් සහ විධික්‍රමයක් පිළිබඳ විමර්ශණය කිරීම.

iii. ආර්ථික කටයුතු කෙරෙහි කාන්තාවන් වැඩි වශයෙන් යොමු කිරීම.

iv. ප්‍රදේශ මූලික කරගනිමින් ස්ථාපනය කොට ඇති සහයෝගී ආයතනික යාන්ත්‍රණය මගින් සිදු වන සැලැසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම.

v. ගම සහ ගමෙන් පිටස්තරය අතර සම්බන්ධතා ගොඩනැංවීම හා සම්බන්ධීකරණය සඳහාත්, සංවර්ධන ක්‍රියාකාරකම් හි ඇගයීම, ප්‍රගති පාලනය, ක්‍රියාත්මක කිරීම හා සැලසුම්කිරීම, අරඹයා වගකිය හැකි, ප්‍රදේශය පදනම් කරගත් තිරසාර යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා විමර්ශනය කිරීම.

**ක්‍රියාකාරකම් සහ ලබාගත් විෂයපාදක තොරතුරු**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා මෙම වැඩසටහන් සංවිධානාත්මක යාන්ත්‍රණයේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කරයි. පළාත් සභාව නියෝජනය කරන ප්‍රධාන නිළධාරීන් සහ දිස්ත්‍රික්කය තුළ කෘෂිකාර්මික සේවා සපයන වෙනත් ආයතන නියෝජනය කරන ප්‍රධාන නිළධාරීන් ද මේ සමග සම්බන්ධ වී ඇත. වී වගාවේ සහ ගෙවතුවල ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා ජනතාවගේ සහභාගීත්වයෙන් ක්‍රියාකාරී වැඩසටහනක් සකස් කරනු ලැබිය.

ක්‍රියාත්මක වැඩසටහන යටතේ යල කන්නයේ දී බීජී 358 වර්ගයේ බීජ වී බුසල් 80 ක් අක්කර 42 ක යායක් සඳහා ගොවීන් 34 දෙනෙකු සඳහා ලබාදුන් අතර, එය යාය ආදර්ශනයක් ලෙස වගා කෙරිණි. මෙම බීජ වී තොගයේ මුළු වටිනාකම රු.52,325 ක් විය. එයින් රුපියල් 32,325 ක ප්‍රමාණයක් ව්‍යාපෘති අරමුදලින් ලබාදුන් අතර ඉතිරිය ගොවීන්ගෙන් ලබා ගැනිණි. සම්පූර්ණ වටිනාකම චක්‍රිය අරමුදලින් පියවා ගන්නා ලදී, වර්තමානයේ ගොවීන්ගේ කෘෂි ණය අවශ්‍යතාවයන් මෙම අරමුදල මගින් සපුරා ගැනීමට හැකි වී ඇති අතර ගොවීන් මෙම චක්‍රිය අරමුදල සාර්ථක ලෙස පවත්වාගෙන යයි.

ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද අනෙක් වැඩසටහන වූයේ, අඹ වගා වැඩසටහන යටතේ කර්ත කොලොම්බන් වර්ගයේ අඹ පැළ 265 ක් ගොවීන් සඳහා ලබාදීම යි. බඳුන් ජල සම්පාදන ක්‍රමය මාර්ගයෙන් මෙම අඹ පැළවලට ජලය සැපයීම සඳහා කළගෙඩි ද මේ සමග බෙදා හැරිණි. මෙම වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක වන අතර, අනාගතයේ දී ගොවීන්ට ප්‍රතිලාභ අත්වනු ඇත.

මෙහි ප්‍රධාන වැව වූ මව්වාගම මහ වැව එහි ජලය මතුපිට ජපන් ජබර, පන් සහ වල් පැළවලින් සමන්විත තට්ටුවක් ලෙස වැවි ජලය වසාගෙන පැතිර තිබිණි. මෙහි දී, තට්ටුව ඉවත්කර වැව පිරිසිදු කරන ලදී, මේ සඳහා රුපියල් 287,121 ක මුදලක් ව්‍යාපෘති අරමුදලින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් දරණ ලදී, වැව පිරිසිදු කිරීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වැය කළ මුළු මුදල රුපියල් 47,495 ක් වේ. මෙම කාර්ය සඳහා වැයවන වියදම ලෙස ඇස්තමේන්තු ගත කර තිබූ මුදල රුපියල් දශලක්ෂයකි. නමුත්, වැය වූ මුදල වූයේ රුපියල් 334,616 ක් පමණි. මෙම කාර්යයේ දී ගොවි ප්‍රජාවගෙන් ද සැලකිය යුතු ශ්‍රම දායකත්වයක් ලැබුන නිසා මෙතරම් අඩු වියදමකින් මෙම කාර්යය අවසන් කරගැනීමට හැකි විය.

ග්‍රාමීය කාන්තාවන් ඵලදායී ආර්ථික කටයුතු සඳහා සහභාගීකර ගැනීමේ අරමුණ යටතේ කාන්තාවන් ගෙවතු වගා කිරීමේ වැඩසහනක් සඳහා සහභාගී කරවාගැනීමට කටයුතු කෙරිණි. උතුරුමැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද "සිරිලියක සවිය" වැඩසටහන යටතේ ගෙවිලියන් දැනුවත් කිරීමෙන් බීජ හා උපදෙස් ලබාදෙමින් වැඩසටහන සඳහා පෙළඹවීමක් කළේය. මේ යටතේ ගෙවිලියන් 20 ක් පමණ ගෙවතු වගාවේ නියැළී සිටිති. ගෙවතු වගා වැඩසටහන යටතේ ගෙවිලියන් එක්රැස් කිරීමට හැකි බවත්, ඔවුන් ඵලදායී ආර්ථික කාර්යයන් සඳහා යොමුකර ගත හැකි බවත් පෙනී ගියේ ය.

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් වෙනත් අත්දැකීම්:**

(අ) ගම් ගණනාවකින් සමන්විත විශාල බල ප්‍රදේශයකට සේවය කිරීමට කෘෂිකර්ම උපදේශකවරයාට සිදු වී ඇති තත්ත්වයක් යටතේ වුවත් විශේෂ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් ලෙස ගම වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු කිරීම,

(ආ) සංවර්ධන කාර්යයන් උදෙසා ධනාත්මක ලෙස සහයෝගය ලබාදීමට ඉදිරිපත් වීමේ සාධනීය ලක්ෂණ මෙම ගම්වාසීන් සතුව ඇති බව පර්යේෂකයින් විසින් හඳුනා ගනු ලැබීම. ප්‍රදේශයේ සේවා සපයන ආයතන විසින් ව්‍යාපෘතියට පෙර මෙම ගම හඳුනා ගැනුණේ පසුගාමී ප්‍රජාවක් සහිත ගම්මානයක් වශයෙනි.

## 5. උඩරට එළවළු වගා ක්‍රමවේදය තුළ සංරක්ෂණ ගොවිතැන් තාක්ෂණික ක්‍රමවල විසරණය පිළිබඳ අධ්‍යයනය: ප්‍රවණතා හා ප්‍රතිඵල

**පර්යේෂණ කණ්ඩායම:** ශ්‍යාමිනී කේ. කුමාර මහත්මිය - සම්බන්ධීකාරිකා
පී.ආර්.වීරක්කොඩි මහත්මිය - සම පර්යේෂිකා

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ, උඩරට එළවළු වගා පද්ධතිය ආශ්‍රිත පාරිසරික ගැටළු හා එළවළු නිෂ්පාදකයන්ගේ දැනුම, විවිධ සංරක්ෂණ ක්‍රම පිළිබඳ ඔවුන් දරන ආකල්ප මෙන් ම ඊට දක්වන ප්‍රතිචාර අධ්‍යයනය කිරීම යි.

මෙම මූලික අරමුණ ඉටු කරගැනීම උදෙසා සිදු කළ ඉහත අධ්‍යයනය අවසන් කරමින් පරිච්ඡේද 6 කින් යුතුව අවසන් කෙටුම්පත සකස් කර ඇති අතර, එම අධ්‍යයන වාර්තාව, "උඩරට එළවළු නිෂ්පාදනයේ ස්වාභාවික සම්පත් කළමනාකරණ දෘෂ්ටි කෝණයන්: ගොවිජන දැනුම, ආකල්ප හා ප්‍රතිචාර" යන උද්ධෘතයෙන් යුතුව පළ කිරීමට නියමිත ය. අධ්‍යයන වාර්තාවේ හැඳින්වීමෙන් අනතුරු ව ඉදිරිපත් කර ඇති සාහිත්‍ය විමර්ශණයේ දී උඩරට එළවළු වගා පද්ධතියේ ප්‍රධාන පාරිසරික ගැටළු හා එහි තිරසරභාවය අරමුණු කොට ගත් පර්යේෂණ හා ව්‍යාපෘති උත්සාහයන් පිළිබඳ විග්‍රහයක් අඩංගු වේ. තව ද උඩරට එළවළු වගා පද්ධතියේ භූගෝලීය ව්‍යාප්තිය මෙන් ම, අධ්‍යයනය සඳහා මහනුවර, මාතලේ, බදුල්ල හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවලින් තෝරා ගත් ගොවි නියැදිය පිළිබඳ සමාජ-ආර්ථික තොරතුරු ද අන්තර්ගතය වේ.

අධ්‍යයනයේ සොයාගැනීම් පිළිබඳ විග්‍රහය තුළ සංරක්ෂිත ගොවිතැන පිළිබඳ ගොවි ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සඳහා ගත් උත්සාහයන් හා ඊට ඔවුන් දක්වා ඇති ප්‍රතිචාර අඩංගු වේ. එහි දී උඩරට එළවළු වගා පද්ධතියේ ප්‍රධාන පාරිසරික ගැටලු තුන වන පාංශු ඛාදනය, පළිබෝධනාශක හා පොහොර භාවිතයෙන් වන දූෂණය කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත.

මෙම අධ්‍යයනයේ දී නිගමනය කෙරුණේ උඩරට එළවළු වගා ක්‍රමවේදය තුළ පසුගිය අඩසියවස තුළ දක්නට ලැබුණාට වඩා වැඩි වර්ධන තත්ත්වයක් පවතින බව යි. යහපත් දේශගුණික තත්ත්වයන්ගෙන් සහාය, තරඟකාරීත්වය, සුදුසු මිලක් ලැබීම යන කාරණා ඊට බලපා තිබේ.

## 6. ජාතික ආහාර නිෂ්පාදන මෙහෙයුම "අපි වවමු - රට නගමු" වැඩසටහන් ඇගයීම

| | | | |
|---|---|---|---|
| **පර්යේෂණ කණ්ඩායම:** | ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | - | සම්බන්ධීකාරක |
| | ආචාර්ය එල්.පී.රූපසේන මහතා | - | උපදේශක |
| | ආචාර්ය ඩබ්.එම්.පී.බී. ගිරාගම මහතා | - | සම පර්යේෂක |
| | එස්. ඇපාසිංහ මහතා | - | සම පර්යේෂක |
| | එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - | සම පර්යේෂක |
| | එච්.එම්.එස්.ජේ.එම්. ගිටිහාමු මහත්මිය | - | සම පර්යේෂිකා |
| | එම්.කේ.එන්. දමයන්ති මෙනවිය | - | සම පර්යේෂිකා |
| | එම්.ඩී. සුසිලා ලූර්දු මහත්මිය | - | සම පර්යේෂිකා |

මෙම අධ්‍යයනය, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය මඟින් රටෙහි ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ක්‍රියාවට නැංවූ "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ වූ ප්‍රධාන සංවර්ධන ක්‍රමෝපායයක් වන "ගෙවතු වගා වැඩසටහන" ඇගයීම සඳහා දරන ලද උත්සාහයකි.

අධ්‍යයනයෙ හි මූලික අරමුණු වූයේ ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙ හි ප්‍රගතිය සොයාබැලීම, වැඩසටහනෙ හි ජාතික අරමුණු ළඟා කරගැනීම සඳහා ගෙවතු වගා සංවර්ධන වැඩසටහන කෙතරම් දායක වී ඇත්ද යන්න සොයාබැලීම සහ ගෙවතු වගා වැඩසටහන වඩාත් ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමත් ය.

**මූලික සොයාගැනීම්:**

i. ඉලක්කගත ගෙවතු සංඛ්‍යාවෙන් 80% කට ඉහළ සංඛ්‍යාවක් ස්ථාපිත කර තිබූ අතර, එවැනි ඉහළ ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා ප්‍රධාන ම හේතුව වූයේ ගෙවතු වගාව සම්බන්ධ ව නිලධාරීන් විසින් දක්වන ලද මහත් වූ උනන්දුව බව ද හෙළි විය.

ii. මෙම වැඩසටහන යටතේ ස්ථාපිත කළ ගෙවතුවලින් 2/3 ක් ම කලින් පැවති ගෙවතු වැඩි දියුණු කිරීම් වූ අතර, මහනුවර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක ඇතුළත් දිස්ත්‍රික් බොහොමයක ගෙවතුවලින් සැලකෙන ප්‍රමාණයක් කලින් සිට ම යම්කිසි මට්ටමකට සංවර්ධනය කර තිබීම මීට ප්‍රධාන හේතුව විය. නමුත් අනුරාධපුර හා හම්බන්තොට වැනි හේන් ගොවිතැන ප්‍රචලිත දිස්ත්‍රික්කවල ග්‍රාමීය මෙන් ම නාගරික ප්‍රදේශවල ද ගෙවතු වගාව අලුතෙන් ඇරඹීම වඩාත් පුළුල්ව සිදු විය.

iii. නිලධාරීන්ගේ උනන්දුව, නොමිලයේ බීජ බෙදා දීම, පුහුණු පංති පැවැත්වීම, ප්‍රචාරණය තුළින් වැඩසටහන ජනප්‍රිය කිරීම සහ ආහාර භෝගයන් හි ඉහළ මිලක් පැවතීම යනාදිය ග්‍රාමීය සහ නාගරික අංශයන් හි නව ගෙවතු සංවර්ධනය වීම කෙරෙහි බලපා ඇත.

iv. ගෙවතු වගා වැඩසටහනෙ හි අරමුණක් වූ තම ගෙවතුවලින් ම ගෘහස්ථ එළවළු අවශ්‍යතාවය සපුරා ගැනීම කෙරෙහි ග්‍රාමීය සහ නාගරික දෙඅංශයන් හි ම ගෙවතු වගාකරුවන් ඉතා සතුටුදායක ලෙස දායක වී තිබිණි.

v. ග්‍රාමීය සහ නාගරික බොහෝ ගෙවතු වගාවන් සඳහා ගොම, සත්ව පොහොර, සහ කොම්පෝස්ට් යොදා ඇත. කෘමි රෝග සහ පලිබෝධ උවදුරු වළක්වාගැනීම සඳහා සම්ප්‍රදායික ක්‍රම භාවිතයට හුරු වී ඇත. ඔවුහු කොම්පෝස්ට් වළ සැකසීම හෝ ජීව කොටු සැකසීම සඳහා ද නැඹුරු වී සිටියහ. ගෙවතු වගා සංවර්ධන වැඩසටහනෙ හි ඇතැම් අරමුණු වූ කාබනික පොහොර භාවිතය හා වස විසවලින් තොර ආහාර ගෙවත්තෙන් නිපදවා ගැනීම වැනි කාරණා කෙරෙ හි මේ වන විට අවධානය යොමු වී තිබේ.

vi ග්‍රාමීය ගෙවත්තකින් කි.ග්‍රෑ. 210 ක පමණ සාමාන්‍ය නිෂ්පාදනයක් ද, නාගරික ගෙවත්තකින් කි.ග්‍රෑ. 120 පමණ නිෂ්පාදනයක් ද ලැබී ඇති අතර, සලකා බලන ලද සමස්ත ගෙවතු සංඛ්‍යාවෙන් 70% ක් ම නිෂ්පාදනයෙන් 75% ක් හෝ ඊට ඉහළ ප්‍රමාණයක් ගෘහස්ථ පාරිභෝජනය සඳහා යොදා ගනී. මෙය ගෙවතු වගා වැඩසටහනෙ හි විශේෂ සාර්ථකත්වයක් දැකිය හැකි දර්ශකයක් ලෙස දැක්විය හැක.

vii ග්‍රාමීය ගෙවතු වගාකරුවන් මුහුණපානු ලැබූ ප්‍රධාන ගැටළුවක් වූයේ, ඉහළ මිල නිසා බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබාගැනීමට අපහසුවීම යි. අනිත් ප්‍රධාන ගැටළුව ලෙස වගාවන්ට සිදුවන සත්ව හානිය වාර්තා විය.

ගෙවතු වගා වැඩසටහන පුළුල් කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි නිර්දේශයන් වනුයේ, ගෙවතු වගා වැඩසටහන පිළිබඳ කෘ.ප.නි.ස.වරුන් සතු දැනුම වර්ධනය කිරීම, ඔවුන් හරහා ජනතාවට ගෙවතු වගාව වර්ධනය සඳහා උපදෙස් ලබාදීම, ගෙවතු වගාකරුවන් සඳහා නොමිලයේ බීජ ලබා දීම මගින් ඔවුන් දිරිමත් කිරීම යනාදිය යි.

**ක්‍රියාත්මක අධ්‍යයන**

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා ගොවිජන අංශවල පරිවර්තන : පවත්නා තත්ත්වයන් හා මතුවන ප්‍රවණතාවන්
2. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය අඩුවීමේ ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය.
3. කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදී සිටින කාන්තාවන්ගේ කාර්යභාරය ස්ථානීය හා කාලීන වශයෙන් වෙනස්වීම.
4. ශ්‍රී ලංකාවේ දුප්පතුන් හා හිතකර වූ ප්‍රතිපත්ති පිළිබඳ විශ්ලේෂණය.
5. පුල්එළිය ගම්මානය නැවත අධ්‍යයනය කිරීමේ අධ්‍යයනය: බිම් මට්ටමේ සංවර්ධනාත්මක ඉඩකඩ, කෘෂිකාර්මික හා ගොවිජන පරිවර්තන හඳුනා ගැනීම.
6. පෝෂණ මට්ටම් දියුණු කිරීම සඳහා පාරම්පරික ආහාර භෝග පදනම් කරගත් නිෂ්පාදන හා අලෙවි ප්‍රතිපත්ති වර්ධනය සඳහා ආහාර පරිභෝජන රටාව පිළිබඳ අධ්‍යයනය කිරීම, ආහාර පරිභෝජන රටාවේ වෙනස්වීම් හා එය සහල් පරිභෝජනය සඳහා බලපා ඇති ආකාරය පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම
7. ශ්‍රී ලංකාවේ සුළුගොවි අංශයේ කෘෂි වෙළෙඳ අනුපාතය වෙනස්වීම
8. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය-ගතික ලක්ෂණ හා ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය.

## පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය

**අවසන් කළ අධ්‍යයන**

**1. ශ්‍රී ලංකාව තුළ විවිධ අංශ කෙරේ ජලය බෙදී යාම : අද්දැකීම් අනුසාර හැසිරීම්**

**පර්යේෂණ කණ්ඩායම:** එම්.එම්.එම්. අහියර් මහතා - සම්බන්ධීකාරක
වී.කේ. නානායක්කාර මහතා - සම පර්යේෂක
එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - සම පර්යේෂක

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ, රට තුළ විවිධ අංශ කෙරේ ජලය බෙදී යාම සඳහා යොදා ගත් යාන්ත්‍රණ හා පසුගිය අද්දැකීම් අනුසාරයෙන් ලබාගත් හැදෑරීම් විශ්ලේෂණය කිරීම යි. අධ්‍යයනය සඳහා ස්ථාන තුනක් තෝරා ගැනුණු අතර, ඒ තුරුවිල, කල්තොට හා ලුණුගම්වෙහෙර යි.

**නියැදි අධ්‍යයන තුන මගින් අනාවරණය වූ කරුණු:**

**නියැදි අධ්‍යයනය - තුරුවිල;**

i. ව්‍යාපෘතිය ආරම්භයේ දී තුරුවිල වැවෙන් ජලය හරවා අනුරාධපුර නගරයේ පානීය ජල අවශ්‍යතාවය සඳහා පිළියම් යෙදීම පිළිබඳ ප්‍රදේශවාසීන්/ගොවීන් විරුද්ධතාවය ප්‍රකාශ කළ ද පසුව ඔවුන්ගේ මතය වෙනස් විය.

ii. ගොවීන් අතර පානීය ජල ව්‍යාපෘතිය සඳහා අවිශ්වාසය හා විරුද්ධතාවය ඇති වීම ට හේතුවක් වූයේ, ව්‍යාපෘතිය පිළිබඳ ඵලදායී දැනුවත් කිරීමක් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක නො වීම ය.

iii. පානීය ජල ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් හට සැලකිය යුතු වාසි ප්‍රදානය කළ ද (සමාජ සුබසාධනය හා ආර්ථික දියුණුව) එය වඩාත් කැපී පෙනෙනුයේ කාන්තාවන් හා ළමුන් අතර යි.

iv. ව්‍යාපෘතිය හේතුකොට ගෙන ඵලදායීතාවය හා කෘෂි නිෂ්පාදනය සඳහා කිසිදු සෘණාත්මක බලපෑමක් ඇති නො විය.

v. තත්කාර්යය තීරණ ගැනීම් මිස ශ්‍රී ලංකාව තුළ විවිධ අංශ කෙරේ ජලය බෙදීම සම්බන්ධයෙන් පිළිගත් මූලධර්ම හෝ ප්‍රතිපත්ති නොමැත.

**නියැදි අධ්‍යයනය - කල්තොට;**

i. ජල විදුලිබල ජනනය සඳහා සමනළ වැව ජලාශය ඉදි කිරීමෙන් පසුව කල්තොට වාරි යෝජනා ක්‍රමය තුළ කෘෂි කර්මාන්තය හා ජල විදුලි බල ජනනයට අවශ්‍ය ජලය බෙදා ගැනීම සඳහා මතභේදයක් තිබුණ ද, කල්තොට වාරි යෝජනා ක්‍රමය මගින් ජලය බෙදීම සම්බන්ධ ව හඳුන්වා දුන් විධිවිධාන හේතු කොටගෙන වියළි කාලයේ ද ගොවීන්ගේ වගා කටයුතු සඳහා ධනාත්මක බලපෑමක් ඇති කර තිබිණි.

ii. ප්‍රදේශයේ ගොවීන් තුළ ආකල්පමය වෙනසක් ඇති කරලීම සඳහාත්, දැනට පවතින යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාවය වැඩිකරලීම සඳහාත් ස්ථායී ජල කළමනාකරණ ප්‍රතිපත්ති ඇති කරලීමේ අවශ්‍යතාවයක් පවතී.

iii. සමාජීය හා සංස්කෘතික හේතු,, වන්දි ලෙස එකවර වැඩි මුදලක් ගෘහස්ථ මට්ටමින් කළමනාකරණයේ දී ඇති ගැටළු, අද ගොවීන් සඳහා ලැබුණු ආදායම ප්‍රමාණවත් නො වීම, කුඩා ඉඩම් හිමියන්ට ලැබුණු වන්දිය ප්‍රමාණවත් නො වීම, ශ්‍රමය විකිණීමට අවස්ථා අඩු වීම යන කාරණා හේතුකොට ගෙන ලංකා විදුලිබල මණ්ඩලය වර්ෂ 1997 දී වාරි ජල පංගුව සඳහා ක්‍රියාත්මක කල වන්දි ක්‍රියා පටිපාටිය ගොවීන් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

**නියැදි අධ්‍යයනය - ලුණුගම්වෙහෙර;**

i. ලුණුගම්වෙහෙර ව්‍යාපෘති ප්‍රදේශයේ 'පැරණි පද්ධතිය' තුළ වගා කරන ගොවීන් පෙළ ජල හිඟයට හේතුව වූයේ පාරම්පරික වාරි වැව් හා ජලාශ විනාශ වීම පමණක් ම නොව, 'නව පද්ධතියේ' ප්‍රදේශ සඳහා ලුණුගම්වෙහෙර ජලාශයේ ජලය 70% ක් මුලුමනින් ම වෙන් කිරීම ද බව යි.

ii. ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය මගින් සත්ව පාලන ව්‍යාපාරය සඳහා අවධානයක් යොමු නො කර තිබූ අතර, කිරිඳිඔය වාරි ජනපද ව්‍යාපෘතිය (KOISP) මගින් මූලික ව අවධානය යොමු කර ඇත්තේ වාරි කෘෂිකර්මාන්තයයි. ගංගාධාර මට්ටම තුළ දී බහුවිධ ඉඩම් හා ජල සම්පත් භාවිතය නො සලකා හැරීම පිළිබඳ පැහැදිලි උදාහරණයක් ලෙස ව්‍යාපෘතිය මගින් පාරම්පරිකව සත්ව පාලනය සඳහා යොදා ගත් වන ලැහැබ් භෝග වගා ඉඩම් ලෙස පරිවර්තනය කිරීම පෙන්නුම් කළ හැකි අතර, මෙහි දී සතුන්ගේ මූලික අවශ්‍යතාවන් ව්‍යාපෘතිය මගින් සැලකිල්ලට බඳුන් නො කළ බව පෙනී යයි.

iii. කිරිඳිඔය ගංගාධාරයේ ජලය බෙදීම හා සම්බන්ධව යොදාගනු ලැබූ ක්‍රියා මාර්ගය අසාර්ථක ප්‍රයත්නයකි. මෙය මගින් විවිධ ආකාරයේ ජලය බෙදා ගන්නා වූ ජල පාරිභෝගිකයන් අතර අසමානතාවක් ඇති කිරීම සිදු වී ඇත. ඒ අතර ම පාරම්පරික සත්ව පාලන ක්‍රම යටතේ සතුන් රැක බලා ගත් ක්‍රමවේදය සතු අයිතීන් අධිකාරීන් විසින් පිළිනොගැනීම හේතුවෙන් සත්ව පාලන ගොවීන්ගේ ගැටළු තවමත් එලෙස ම පවතී.

## 2. ශ්‍රී ලංකාවේ මතුපිටින් ගලා යන වැසි ජලය රැස් කිරීමේ නැඹුරුතාවය තක්සේරු කිරීම

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ නම්, දැනට පවතින මතුපිටින් ගලා යන වැසි ජලය රැස් කිරීමේ පද්ධතිවල ක්‍රියාකාරීත්වය සහ මැදිහත්වීම තක්සේරු කිරීම වේ. මෙහි දී නියං විපත්වල බලපෑම අඩු කිරීමේ මෙවලමක් ලෙස, වියළි ප්‍රදේශවල ජල හිඟය අඩු කිරීම සඳහාත් මතුපිටින් ගලා යන වැසි ජලය රැස් කිරීමේ පද්ධතිවල භාවිතය පිළිබඳ සලකා බලනු ලැබේ.

**පර්යේෂණ කණ්ඩායම:** එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා - සම්බන්ධීකාරක
එම්.එම්.එම්. අනියාර් මහතා - සම පර්යේෂක

**මූලික සොයාගැනීම්:**

i. මතුපිට අපදා (ගලා යන) වැසි ජල පොකුණු/ටැංකිවල සංචිත ජලය කෘෂිකර්මය, සත්ව පාලනය, ජලජීවී වගාව සහ ගෘහස්ථ පරිභෝජනය යන විවිධ කාර්යයන් සඳහා ගොවීන් විසින් ප්‍රයෝජනයට ගනු ලබන බව අධ්‍යයනයේ

සොයාගැනීම් තුළින් පෙන්නුම් කරයි. ඒ අතර ම එම පොකුණු/ටැංකි වඩාත් ජනප්‍රිය වී ඇත්තේ උස් බිම් හා ගෙවතුවල භෝග වගාව සඳහා යි.

ii. ගොවීන්ගෙන් 35% ක් පමණ පහත් බිම්වල වගා කටයුතු සඳහා අතිරේක ජල ප්‍රභවයක් ලෙස මෙම පොකුණු/ ටැංකි භාවිතා කරති. මෙම මතුපිට අපදා වැසිජල පොකුණු/ටැංකි හඳුන්වා දීමෙන් පසුව කන්න භෝග වගාවේ යෙදෙන ගොවීන් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, යල කන්නය තුළ එය වඩාත් කැපී පෙනේ.

iii. මතුපිට අපදා වැසිජල පොකුණු/ටැංකි භාවිත ගොවීන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් ඔවුන්ගේ ගොවිපොළ පද්ධතියට නව භෝග හඳුන්වා දීම සිදු කර තිබෙන අතර, වගා කරන භූමි ප්‍රමාණයේ ද වැඩිවීමක් පෙන්නුම් කරයි.

iv. වියළි තත්ත්ව යටතේ වර්ෂාපෝෂිත වී වගා කරන ගොවීන් සංඛ්‍යාව පොකුණු/ටැංකි හඳුන්වා දීමත් සමග සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.

v. වියළි කාලවල දී ප්‍රදේශයේ පවතින ජල හිඟය කෙතෙක් දැ යි තීරණය කිරීමට නිදසුනක් ලෙස මතුපිට අපදා වැසි ජල දිය පොකුණු භාවිත කරන ගොවීන්ගේ 72% ක් එක ම ජල ප්‍රභවය ලෙස පොකුණු/ටැංකි හරහා රැස් කරගත් ජලය භෝග වගාව සඳහා භාවිත කරති.

vi. මතුපිට අපදා වැසිජල පොකුණු/ටැංකි ආශ්‍රයෙන් සත්ව පාලනයේ නියැළෙන ගොවීන්ගෙන් 85% ක් ගව පාලනය ද, 25% ක් කුකුළු පාලනයේ ද යෙදී සිටීම කැපී පෙනෙන සිදුවීමකි. සත්ව පාලනය සිදු කරන ගොවීන්ගෙන් 6% ක් පමණ මෙම පොකුණු/ටැංකිවල ජලය පූර්ණ වශයෙන් ම ඔවුන්ගේ සත්ව පාලන කටයුතු සඳහා යොදා ගනී.

vii. සත්ව පාලනය සිදු කරන ව්‍යවසායකයන්ගෙන් 69% ක ප්‍රමාණයක් තම ගොවිපොළ පද්ධතිය සඳහා මෙම මතුපිට අපදා වැසි ජල පොකුණු/ටැංකි හඳුන්වා දීමෙන් පසු සත්ව නිෂ්පාදන ආශ්‍රිත ආදායම වැඩි දියුණු වූ බව පිළිගනිති. ඒ අතර 2% ක් වූ සත්ව පාලන ගොවීන් ප්‍රමාණයක් මෙම පොකුණු/ටැංකි එක ම ජල ප්‍රභවය ලෙස ජල ජීවී වගාව සඳහා යොදා ගනිති. කෙසේ වෙතත් සත්ව පාලනය සිදු කරන ගොවීන්ගෙන් 31% ක ප්‍රමාණයක් පොකුණු/ටැංකි භාවිතයේ ජල ජීවී වගාව සිදු කරන අතර ම, භෝග වගාව සඳහා ද මෙම පොකුණු/ටැංකි මගින් රැස් කරගත් ජලය භාවිතා කරති.

viii. කන්නය පුරා ම මෙම මතුපිට අපදා වැසි ජල පොකුණු/ටැංකිවල ජලය නොමැතිවීම, නිර්දේශිත කාලය තුළ මත්ස්‍යයන්ගේ අඩු වර්ධන වේගය සහ ජල ජීවී වගාව පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ගොවීන් අතර නොමැතිකම, ජලජීවී වගාවට සම්බන්ධ ප්‍රතිලාභීන් ඉස්මතු කරන ප්‍රධාන ගැටළු අතර වෙයි.

ix. අධ්‍යයනය සිදු කළ නියැදියේ 48% ප්‍රතිලාභීන් ප්‍රමාණයක් මතුපිට අපදා වැසිජල පොකුණු ටැංකිවල රැස් කරගත් ජලය විවිධ ගෘහ අවශ්‍යතා සඳහා යොදා ගත්ත ද පානීය ජල ප්‍රභවයක් ලෙස භාවිත නොකරති. ඔවුන්ගෙන් 85% කගේ පිළිගැනීම වූයේ, මෙම පොකුණු/ටැංකි ඉදි කිරීමෙන් පසුව ගොවිපොළ ක්ෂුද්‍ර පරිසරය තුළ ජීවිතාවයේ ධනාත්මක වර්ධනයක් ඇති වූ බව යි.

x. මතුපිට අපදා වැසිජල පොකුණු/ටැංකි යටතේ සත්ව පාලනය, භෝග වගාව හා ජල ජීව වගාව ගොවිපොළ පද්ධතිය තුළට ඒකාබද්ධ කිරීමෙන් විශේෂයෙන් වියළි ප්‍රදේශවල කෙටි කාලයක් තුළ ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි බව පෙන්නුම් කරයි.

xi. විවිධ තත්ත්ව යටතේ සිදු කරන ලද ආර්ථික විශ්ලේෂණයෙන් ගම්‍ය වනුයේ, මතුපිට අපදා වැසිජල පොකුණු සම්බන්ධයෙන් අධ්‍යයනය කළ සියලු තත්ත්ව යටතේ ආර්ථිකය ස්ථායී බව යි. පොකුණුවල වැලි තැන්පත් වීම ප්‍රධාන ගැටළුව ලෙස හඳුනාගෙන ඇති අතර, අනෙකුත් ගැටළු අතර, පොකුණේ සිදුරු තුළින් ජල කාන්දුව, වාෂ්පීකරණය මගින් ජලය අඩු වීම, පොකුණු පතුළේ දී ජලය පහළට කාන්දු වීම, වන සතුන් හා ගෘහස්ථ සතුන් මගින් පොකුණේ බැම්/බිත්තිවලට සිදු වන හානිය, පොකුණ භාවිතයේ දී පසුකාලීන ගොවීන් මුහුණපාන ගැටළු ලෙස කැපී පෙනේ.

**3. ශ්‍රී ලංකාවේ කුඩා ග්‍රාමීය වැව් පද්ධති: ඒවා පරිණාමය, වී ඇති අයුරු, ව්‍යාප්තිය හා අත්‍යවශ්‍ය ක්‍රියාකාරිත්වයන් පිළිබඳ විෂය සංග්‍රහය**

**කතෘ** : ආචාර්ය සී. .ආර්. පානබොක්ක

**පරිච්ඡේද පෙළගැස්ම**

i. හැඳින්වීම
ii. පූර්ව ඓතිහාසික යුගය (ක්‍රිස්තු පූර්ව 500 සිට 300 ක්‍රි. වර්ෂ) උතුරු මැද පළාතේ කුඩා ග්‍රාමීය වැව් පරිණාමය
iii. මධ්‍ය ඓතිහාසික යුගය (ක්‍රි. ව. 300 සිට 100 ක්‍රි. ව.) තෙත් බිම්වල කුඹුරුවල වී වගාව පැතිරීම : එල්ලංගා වැවු පද්ධති ඇරඹීම හා ක්‍රියාත්මක වීම
iv. පොලොන්නරුව රාජධානිය - මහා වාරිමාර්ග පද්ධති 1000 ක්‍රි. ව. සිට 1250 ක්‍රි.ව.
v. සාම්ප්‍රදායික කුඩා ග්‍රාමීය වැව් වාරිමාර්ග ආකාරය කිහිපයක්
vi. ග්‍රාමීය වාරිමාර්ග කටයුතු විමර්ශනයට විද්‍යාත්මක පිවිසුමක්

**ක්‍රියාත්මක අධ්‍යයන**

**1. ශ්‍රී ලංකාවේ අමුණු පද්ධති : නිල්වලා ජල ද්‍රෝණිය පිළිබඳ සමාජ ආර්ථික විශ්ලේෂණය**

**වෙනත් කටයුතු**

**1. ශ්‍රී ලංකා ජල සම්පත් සංවර්ධන වාර්තාව යාවත්කාලීන කිරීම සඳහා වන තොරතුරු ලබාගැනීමේ වැඩමුළුව.**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය යුනෙස්කෝ ජගත් ජල ඇගයුම් වැඩසටහනේ කොටස්කරුවකු වේ. යුනෙස්කෝ මූල්‍ය ආධාර ඇතිව කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය සමග ඒකාබද්ධ වී දායක වන්නන්ගෙන් තොරතුරු ලබාගැනීමේ එක් දින වැඩමුළුවක් 2008.03.18 දිනයේ දී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් සංවිධානය කරන ලදී. වැඩමුළුවේ මූලික අරමුණ වූයේ, මෙම වාර්තාව යාවත්කාලීන කිරීම සඳහා විශේෂඥයන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීම ය.

## අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

ජීවන වියදම් සමාලෝචන කමිටුව සඳහා අවශ්‍ය වෙළෙඳපොළ මිල හා තොරතුරු ලබා ගැනීම සඳහා වූ "අලෙවි පර්යේෂණ ඒකකය" යනුවෙන් මුල්කාලීන ව හැඳින්වූ මෙම "අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය", වර්ෂ 1979 දී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ස්ථාපිත කරන ලදී.

මෙම අංශය, 2008 වර්ෂයේ දී, එහි කාර්යය වඩාත් පුළුල් කරමින්, ශ්‍රී ලංකා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පවත්වනු ලබන "ජාතික ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන වියදම් සමාලෝචනය පිළිබඳ කමිටුවට" අවශ්‍ය කෘෂිකාර්මික නිෂ්පාදන හා අලෙවිකරණය (ආහාර ද්‍රව්‍යයන්) පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දයක වන වෙළෙඳපොළ තොරතුරු අඛණ්ඩව සපයයි. මේ අතර, මෙම අංශය, ප්‍රතිපත්ති සම්පාදකයන්ටත්, ව්‍යවසායකයන්ටත්, වෙළෙඳුන්, ගොවීන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු වූවන්ට අවශ්‍ය තොරතුරු හා දත්ත ලබාදීමේ කාර්යයෙ හි ලා නිරත විය.

මෙයට අමතර ව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන "රජයේ ආහාර මිල දී ගැනීමේ සහ ඇගයීම් කිරීමේ ඒකකය" සඳහා ද අවශ්‍ය මිල තොරතුරු හා දත්ත සපයනු ඇත. ඒ මගින් ගුවන්, නාවික, යුද හමුදාවන්, රජයේ ආරෝග්‍යශාලා සහ බන්ධනාගාර වැනි රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය ආහාර මිල දී ගැනීමේ තීරණයන් උදෙසා සඳහා දයක වනු ඇත.

**වෙළෙඳපොළ දත්ත හා තොරතුරු එකතු කිරීමේ අඛණ්ඩ වැඩසටහන**

**ආහාර සහ වෙළෙඳපොළ තොරතුරු ව්‍යාපෘතිය.**

| | | | |
|---|---|---|---|
| **පර්යේෂණ කණ්ඩායම:** | ටී.ඒ. ධර්මරත්න මහතා | - | සම්බන්ධීකාරක |
| | සී.පී. හතුරුසිංහ මහත්මිය | - | සම පර්යේෂිකා |
| | රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය | - | සම පර්යේෂිකා |
| | රුවිනි විදානපතිරණ මහත්මිය | - | සම පර්යේෂිකා |
| | ටී.පී. සෝමරත්න මහතා | - | සම පර්යේෂක |
| | එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - | සම පර්යේෂක |
| | දුමින්ද ප්‍රියදර්ශන මහතා | - | සම පර්යේෂක |
| | එන්.පී.ජී. සමන්ත මහතා | - | සම පර්යේෂක |
| **උපකාරක කණ්ඩායම:** | සංඛ්‍යාන නිලධාරීන්/සහකාරවරු | - | 14 (ප්‍රධාන කාර්යාලය හා ක්ෂේත්‍ර සේවා) |
| | අනියම් විමර්ශකවරු | - | 18 (ප්‍රධාන කාර්යාලය හා ක්ෂේත්‍ර සේවා) |

මෙම අංශය නිරන්තරයෙන් ම නිවැරදි හා කාලීන දත්ත හා තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයන්ට සපයනු ඇත. එම තොරතුරු කොළඹ සහ අවට නාගරික සිල්ලර වෙළෙඳ මධ්‍යස්ථාන 09 කින් එකතු කරනු ලබයි. එවා නම්, පිටකොටුව, තොටළඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, කඩවත, කිරිබත්ගොඩ යන වෙළෙඳපොළ වේ. තොග මිල ගණන් කොළඹ-පිටකොටුව තොග වෙළෙඳපොළින් ලබා ගනී. මෙයට අමතර ව දිවයිනේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන හා පාරිභෝජන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිල්ලර හා තොග වෙළෙඳ මධ්‍යස්ථාන 24කින් ද මිල තොරතුරු එකතු කරනු ඇත.

දත්ත එකතු කිරීමේ කාර්යයන් සඳහා සංඛ්‍යා නිලධාරීන් 06 දෙනෙකු, සංඛ්‍යාන සහකාරවරුන් 07 දෙනෙකු හා අනියම් විමර්ශකවරුන් 20 දෙනෙකු සේවයේ යොදවා ඇත. මෙයින් සංඛ්‍යාන නිලධාරීන්/සහකාරවරුන් හා නියම් විමර්ශකවරුන් 15 දෙනෙක් ක්ෂේත්‍රයේ දත්ත එකතු කිරීමේ කටයුතුවල නිරත වී සිටිති.

ක්ෂේත්‍රයේ දත්ත එකතු කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථාන ලෙස 2008 වර්ෂයේ දී කුරුණෑගල, නිකවැරටිය, දඹුල්ල, මාතලේ, අනුරාධපුරය, තඹුත්තේගම, පොලොන්නරුව, නුවරඑළිය, හඟුරන්කෙත, බදුල්ල, කැප්පෙටිපොළ, රත්නපුර, ඇඹිලිපිටිය, හම්බන්තොට, තිස්සමහාරාම, මාතර, ගාල්ල, කළුතර, මොණරාගල, දෙහිඅත්තකණ්ඩිය, අම්පාර, පුත්තලම සහ මරදගහමුල යන නාගරික මධ්‍යස්ථානයන් විය. මෙයට අමතර ව, පිටකොටුව, මහනුවර, දඹුල්ල, නොරොච්චෝල, මරදගහමුල සහ මීගොඩ යන ආර්ථික මධ්‍යස්ථානවලින් ආහාර ද්‍රව්‍යයන්ගේ තොග මිල ගණන් දෛනික ව එකතු කෙරිණි. මෙම දත්ත හා තොරතුරු

විද්‍යුත් සංනිවේදන මාධ්‍යයන් මඟින් ප්‍රකාශයට පත් කළ අතර, එමඟින් නිෂ්පාදකයන්ට සහ වෙළෙඳුන්ට එම අවස්ථාවේ දී ම තොග වෙළෙඳපොළ පැවති තොග මිල ගණන් දැන ගත හැකි විය. කොළඹ හා අවට නාගරික මධ්‍යස්ථානවල තොග හා සිල්ලර මිල ගණන් ද දැන ගත හැකි විය. මේ අතර කොළඹ හා අවට නාගරික මධ්‍යස්ථානවල තොග හා සිල්ලර මිල ගණන් නිෂ්පාදන ප්‍රදේශයන් හි ගොවිපොළ මිල ගණන්, විශ්ලේෂණයට භාජනය කරමින්, සෑම සිකුරාද දිනක දී ම "සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව" ප්‍රකාශයට පත් කරන ලදී.

**2008 වසර සඳහා ප්‍රගතිය**

- සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව - කලාප 52 ක් ප්‍රකාශයට පත් කරන ලදී. (ඉංග්‍රීසි හා සිංහල)
- මාසික ආහාර තොරතුරු පිළිබඳ විවරණිකාව - කලාප 12 ක් ප්‍රකාශයට පත් කරන ලදී. (ඉංග්‍රීසි හා සිංහල)
- වසර පුරා ම ක්‍රියාත්මක වූ පරිදි "දෛනික ආහාර මිල ගණන්" අදාළ ආයතනවලට ලබා දෙන ලදී.
- දෛනික හා සතිපතා තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන සඳහා ලබා දෙන ලදී.
- රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේ ආයතන මෙන් ම පුද්ගලයන් විසින් කරනු ලබන තොරතුරු හා දත්ත ඉල්ලීම්, මෙම වසර තුළදීත් ඒ අයුරින් ම සම්පූර්ණ කරන ලදී.

**අවසන් කළ අධ්‍යයන**

**1. කෘෂි රසායනික ද්‍රව්‍ය සඳහා මිල ආන්තිකයන් විශ්ලේෂණය කිරීම පිළිබඳ අධ්‍යයනය**

නොවැම්බර් මාසය තුළ දී අධ්‍යයනය, කාර්ය පත්‍රිකාවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

**පර්යේෂණ කණ්ඩායම:** රුවිණි විදානපතිරණ මහත්මිය - සම්බන්ධීකාරිකා
රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය - සම පර්යේෂිකා

**අධ්‍යයනයේ අරමුණු:**

- ශ්‍රී ලංකාවේ විවිධ ආයතන මඟින් අලෙවි කරනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය වල මි.ර.ගා. (CIF) අගයන් සහ සිල්ලර මිල ගණන් පිළිබඳ දත්ත පදනමක් සකස් කිරීම.
- ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන කෘෂි රසායනික ද්‍රව්‍ය මි.ර.ගා. අගයන් සහ සිල්ලර මිල ගණන් අතර මිල ආන්තිකයන් ගණනය කිරීම.
- කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිකරණ ක්‍රියාවලියේ වෙළෙඳපොළ පිරිවැය ව්‍යුහය (Cost Structure) පිළිබඳ අධ්‍යයනය කිරීම.

**මූලික සොයා ගැනීම්**

i. කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිකරණයේ දී වෙළඳපොළ පිරිවැය අනුව, වරාය තුළ දී ගොඩබෑම සඳහා වන මුළු පිරිවැය 8%-10% අතර ප්‍රමාණයකි. එසේ ම කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිකරණ ආයතන මඟින් මුළු නිෂ්පාදන පිරිවැයෙන් 40කද-45% ක ප්‍රමාණයක් කර්මාන්තශාලාවල වියදම් සහ අනෙකුත් ආයතනික වියදම් සඳහා වැය කරයි. කෘෂි රසායනික ද්‍රව්‍ය බෙදාහරින්නන් විසින් 25%-30% ක ආන්තිකයක් පවත්වාගෙන යනු ලබන අතර, එය අලෙවිකරණ සමාගම අනුව වෙනස් විය හැකි ය.

ii. වියදම් පිරිවැය ව්‍යුහයට අනුව, මි.ර.ගා. මිල සහ ඇසුරුම්වල සඳහන් කර ඇති මිල (Label Prices) අතර වෙනස ප්‍රතිශතයක් ලෙස 150% කි. නමුත්, ක්ෂේත්‍ර විමර්ශනවලට අනුව එය ප්‍රතිශතයක් ලෙස 120% සිට 250% අතර අගයකින් විචලනය වන බව දක්නට ලැබිණි. එය කෘෂි රසායනික ක්‍රමය අලෙවිකරණ සමාගම සහ අදාළ නිෂ්පාදනය මත රඳා පවතී. කර්මාන්තශාලාවල නඩත්තු කටයුතු සඳහා ආසන්න වශයෙන් 20%ක පිරිවැයක් වැය වන අතර, ආයතන මඟින් 20%-25% අතර ප්‍රමාණයක දළ ආයතනික ආන්තිකයක් පවත්වාගෙන යනු ලබයි. තව ද, සියලු ම කෘෂි රසායනික ද්‍රව්‍ය 15%ක එකතු කළ අගය මත බද්දකට (VAT) යටත් වේ.

iii. කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිකරණයේ දී දැඩි තරඟකාරීත්වයක් දක්නට ලැබෙන හෙයින්, ප්‍රධාන බෙදාහරින්නන් (Main Dealers) විශාල වශයෙන් වට්ටම් ලබා දෙනු ලබන අතර, එම ප්‍රමාණය අලෙවිකරණ ආයතනය අනුව වෙනස් වේ. එය 20%-25% අතර ප්‍රමාණයක් වන අතර බෙදා හරින්නන් සඳහා වන ශුද්ධ ලාභය 5%ක් පමණ වේ. ක්ෂේත්‍ර මට්ටමේ දී මෙම වට්ටම් ප්‍රමාණය 10% සිට 30% දක්වා අගයක පැවති අතර, එයට ශුද්ධ ලාභය 5%ට අඩු හෝ වැඩි හෝ විය හැකි ය.

iv. බොහෝ නිෂ්පාදන ප්‍රදේශවල කෘෂි රසායනික ද්‍රව්‍ය සඳහා සිල්ලර මිල ගණන් ඒවා ඇසුරුම් කළ ලේබල්වල සඳහන් කර ඇති මිලට වඩා අඩු අගයකි. ලබා දෙන වට්ටම් ප්‍රමාණය අනුව එක ම කෘෂි රසායනික ද්‍රව්‍ය සඳහා වුව ද, සිල්ලර මිල ගණන් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය හැකි ය.

## 2. අතිරේක ආහාර භෝග නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| සී.පී. හතුරුසිංහ මහත්මිය | - | සම්බන්ධීකාරිකා |
| ටී.පී. සෝමරත්න මහතා | - | සම පර්යේෂක |
| රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය | - | සම පර්යේෂිකා |
| රුචිනි විදානපතිරණ මහත්මිය | - | සම පර්යේෂිකා |

### අධ්‍යයනයේ අරමුණු

ප්‍රධාන අරමුණ වන්නේ, අතිරේක ආහාර භෝග නිෂ්පාදනය අඩුවීමට බලපාන ලද හේතු සාධක හා අතිරේක ආහාර භෝග නිෂ්පාදන අංශයේ ව්‍යුහය, පැවැත්ම හා එහි ප්‍රවර්ධනය විමර්ශනය කිරීම ය. අනෙකුත් අරමුණු පහත සඳහන් වේ.

i. නිෂ්පාදනය හා ඉල්ලුම සම්බන්ධ ව පසුගිය කාලයේ පැවති සහ වර්තමාන තත්ත්වය විමර්ශනය කිරීම
ii. නිෂ්පාදනය පුළුල් කිරීමට ඇති ශක්‍යතාවය අධ්‍යයනය කිරීම
iii. නිෂ්පාදනය සහ නිෂ්පාදනවල ප්‍රමිතිය ප්‍රවර්ධනය සඳහා අති බාධක හඳුනා ගැනීම
iv. ගොවිජන අංශයේ ආහාර අනාරක්ෂිතතාවය පිළිබඳ ව අධ්‍යයනය කිරීම
v. භෝග වගා කිරීමේදී සැකසීමේ දී හා අලෙවියේ දී නව තාක්ෂණය භාවිතා කිරීම සම්බන්ධයෙන් ගොවීන්ගේ ප්‍රතිචාර අධ්‍යයනය කිරීම
vi. අතිරේක ආහාර භෝගවල අලෙවි ආන්තිකයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම
vii. මෙම අංශයේ සංවර්ධනය සම්බන්ධයෙන් සුදුසු ප්‍රතිපත්ති යෝජනා කිරීම

### මූලික සොයා ගැනීම්

i. 2000 වසරේ සිට අතිරේක ආහාර භෝගයන්ගේ වගා බිම් ප්‍රමාණය අඩු වී ඇති අතර, වර්තමානය වන විට එය හෙක්ටයාර් 20,000 මට්ටමක පවතී. පෞද්ගලික අංශයේ සමාගම සමග ඇති කරගෙන තිබෙන ඉදිරි ගිවිසුම් හේතුවෙන් බඩඉරිඟු වගා බිම් ප්‍රමාණය ඉහළ ගොස් තිබේ. දේශීය වගාකරුවන් විසින් අභිජනනය කරන ලද "දඹල" නමැති කව්පි වර්ගය අම්පාර දිස්ත්‍රික්කය තුළ වැඩි වගා ප්‍රගතියක් වාර්තා කරන අතර, එහි ප්‍රමිතිය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් හොඳ නිෂ්පාදන මිලක් ලබා ගැනීමට හැකි වී තිබේ.

ii. ඉහළ ප්‍රමිතියෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශය පසුගාමී මට්ටමක පැවතීම නිසා පෞද්ගලික අංශය සීමිත මට්ටමකින් ඒවා ලබාදීමට ඉදිරිපත් වී සිටී. තව ද, ඉහළ වටිනාකමක් ලබා දෙන භෝග සම්බන්ධයෙන් සිදු කරන පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා ප්‍රමාණවත් නොවේ.

iii. ප්‍රමිතියෙන් බාල බීජ හේතුවෙන් වෙළෙඳපොළට ඉදිරිපත් වන නිෂ්පාදන සඳහා ආයතනික නිෂ්පාදනවලට සාපේක්ෂ ව අඩු ඉල්ලුමක් පවතී. 1996 භෝග නිෂ්පාදනය 70% කින් අඩු වී තිබේ. 2004-2007 කාලය තුළ රජය මඟින් ලබා දෙන ලද ඉහළ ආරක්ෂණය හේතුවෙන් ලොකුළූණු නිෂ්පාදනය 145%කින් වැඩි වී ඇත. මේ අතර රේගු බද්ද කිලෝ එකක් සඳහා රු. 3 සිට රු. 9 දක්වා වැඩි කරන ලදී.

iv කාලීන ව රේගු බදු ප්‍රතිශතයන් වෙනස් කිරීම මෙම අංශයේ ප්‍රගමනය සඳහා දිගුකාලීන වශයෙන් අයහපත් අයුරින් බලපා තිබේ. මෙම ප්‍රතිපත්තිය මෙම අංශයේ නිෂ්පාදනය, අලෙවිය සම්බන්ධයෙන් අකාර්යක්ෂමතාවය වැඩි කර තිබේ. මෙම ප්‍රතිපත්තිය වෙළෙඳපොළ මිල ගණන්වල යථා ස්වරූපය විකෘති කර පෙන්වන අතර, එය නිෂ්පාදකයාට මෙන් ම පාරිභෝගිකයාට අහිතකර ලෙස බලපානු ලැබේ. තව ද අවාරයේ දී සියලු ම ජනතාව පාරිභෝගිකයෝ වෙති.

v මෙම අංශයේ ඇති අවිනිශ්චිතතාව හේතුවෙන් නිෂ්පාදකයන්, වෙළෙඳුන් සහ සැපයුම්කරුවන් මෙම අංශයේ ආයෝජනයෙන් බැහැර වේ. එම නිසා සාම්ප්‍රදායික ආහාර භෝග සඳහා ඉල්ලුම ඉහළ ගොස් ඇත. නිෂ්පාදනය හා ඉල්ලුම අතර ඇති මෙම පරතරය පියවීම සඳහා සමස්ත සැපයුමෙන් 25%-30% අතර ප්‍රමාණයක් ආනයනය මඟින් සපුරා ගැනීමට සිදු වී තිබේ.

## 3. යෝජිත සියඹලාණ්ඩුව- මොණරාගල සීනි කර්මාන්ත ව්‍යාපෘතියේ සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම:** ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා - සම්බන්ධීකාරක
ආචාර්ය එල්.පී. රූපසේන මහතා - සම පර්යේෂක

**මූල්‍ය දායකත්වය:** උක් පර්යේෂණ ආයතනය

යෝජිත සියඹලාණ්ඩුව- මොණරාගල උක් පර්යේෂණ පිළිබඳ සමාජ-ආර්ථික පර්යේෂණ අධ්‍යයනය, උක් පර්යේෂණ ආයතනය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයකි. මෙම ව්‍යාපෘතියෙන් අදළ උක් වගා බිම් ප්‍රදේශයන් හඳුනා ගන්නා ලද අතර, එම වගා බිම් අදළ කර්මාන්තායතනය පිහිටුවීමට අදහස් කරන ස්ථානයේ සිට කි.මී. 40ක් දක්වා දුර ප්‍රමාණයක විහිදී ඇත. අධ්‍යයනය, මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව හා මොණරාගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුළ පිහිටි ග්‍රාම නිලධාරී වසම් 61 ක සිදු කරන ලදී.

**අධ්‍යයනයේ අරමුණු**

i. ප්‍රදේශයේ ජන ව්‍යාප්තිය හා ලක්ෂණ, අධ්‍යාපන මට්ටම, රැකියා හා විරැකියාවන්ගේ ප්‍රමාණය, ඉඩම් අයිතිය හා ඉඩම් පරිහරණ රටාවන් පිළිබඳ විධිමත් අවබෝධයක් ලබාගැනීම.
ii. ප්‍රදේශයේ පවතින පාදක ව්‍යුහමය පහසුකම් පිළිබඳ පරීක්ෂා කිරීම.
iii. ප්‍රදේශයේ වගා කරන ප්‍රධාන කෘෂි භෝගයන්ගේ ලාභදායිත්වය ගණනය කිරීම
iv. උක් වගා කළ හැකි ඉඩම් ප්‍රමාණයේ ධාරිතාවය ගණනය කිරීම.

මේ සඳහා යොදු ගත් මුළු භූමි අක්කර 165,593 කින් විය යුතු විය. මින් වන ජීවීන් හා වනාන්තර සඳහා වෙන් කළ ප්‍රමාණය 30%ක් ද, පෞද්ගලික හිමිකාරීත්වය සහිත 5.9% ක් ද, අනවසරයෙන් අල්ලා ගත් ප්‍රමාණය 20% ක් ද, රජයේ ඉඩම් 17% ක් ද විය. මෙම ප්‍රමාණය ජාතික තලය හා සසඳද් දී විශාල අගයකි. 18.18% ක ප්‍රමාණයක් ම ගෙවතු අක්කර 5 කට වඩා පැතිර නො ගිය එවා විය. තවත් අක්කර 44,785 ක් උක් වගාව සඳහා සංවර්ධනය කළ හැකි ඉඩම් ලෙස හඳුනා ගැනිණි.

## 4. ආහාර අනාරක්ෂිතතාවය සහ එහි අවධානම පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය

**පර්යේෂණ කණ්ඩායම:** ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මහත්මිය - සම්බන්ධීකාරිකා

**මූල්‍ය දායකත්වය:** ආහාර හා කෘෂිකර්ම සංවිධානය

**අධ්‍යයනයේ අරමුණු:**

- ජාතික, ප්‍රාදේශීය, කොට්ඨාස හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ආහාර අනාරක්ෂිතතාවය හා එහි අවධානම විශ්ලේෂණ කළ හැකි තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම.
- දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරුවීමේ අවධානම් සහිත ප්‍රදේශ හඳුනාගැනීම හා ඒ ප්‍රදේශ සඳහා ප්‍රතිපත්තිමය යෝජනා, උපාය මාර්ගික පර්යේෂණාත්මක පිළියම් ඉදිරිපත් කිරීම.
- මෙම තොරතුරු අදළ අංශයන් වෙත ඉදිරිපත් කිරීම (විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින්)

**ඉටු කරන ලද කාර්යයන්:**

(අ) ප්‍රතිපත්තිමය කරුණු හා අදළ විශ්ලේෂණයන් ඇතුළත් වාර්තා සකස් කිරීම.

i. ප්‍රදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආහාර අනාරක්ෂිතතාවයන්ට හා පීඩාවන්ට ගොදුරු විය හැකි කොටස් හඳුනා ගැනීම.

ii. ඒ සඳහා විසඳුම් ලෙස ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හා රාජ්‍ය මැදිහත්වීම්

(ආ) අන්තර්ජාලය යටතේ තොරතුරු ලබා ගැනීමේ වෙබ් අඩවියක් පිහිටුවීම (www.asiafivims.net/sri/page.jspx)

(ඇ) ප්‍රවෘත්ති විවරණිකාවක් සකස් කිරීම.

## 5. නව පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ඇගයීමේ අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම:** ආචාර්ය වසන්ති වික්‍රමසිංහ මහත්මිය - සම්බන්ධීකාරිකා
ගීතානි සමරසිංහ මහත්මිය - සම පර්යේෂිකා
එස්. ඇපාසිංහ මහතා - සම පර්යේෂක

**අධ්‍යයනයේ අරමුණු:**

i. ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ක්‍රියාත්මක පොහොර සහනාධාර ප්‍රතිපත්තිය විමර්ශනය කිරීම.

ii. රටෙහි වී නිෂ්පාදනය කෙරෙහි පොහොර සහනාධාර ක්‍රමයන්ගේ පවතින බලපෑම අධ්‍යයනය කිරීම.

iii. පොහොර සහනාධාර වැඩසටහන සහ වාර්ෂික ව වැයවන පිරිවැය ප්‍රමාණය යටතේ වී වගා අංශයෙ හි පොහොර භාවිතය පිළිබඳ කාර්යක්ෂමතා අධ්‍යයනය කිරීම.

iv. නව පොහොර සහනාධාර ක්‍රමය තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ පොහොර මිලදී ගැනීම හා බෙදා හැරීමේ ක්‍රම පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක යෙදීම.

v. පොහොර සහනාධාර ක්‍රමය සඳහා විකල්ප වශයෙන් ආර්ථික ශක්‍යතාවයක් සහිත කාර්යක්ෂම සුදුසු ප්‍රතිපත්ති යෝජනාවක් ඉදිරිපත් කිරීම.

**මූලික සොයා ගැනීම්:**

i. ලෝක ආහාර අර්බුදය හමුවේ නව පොහොර සහනාධාර වැඩපිළිවෙළ, ආර්ථික කාර්යක්ෂමතාවය, ආහාර සුරක්ෂිතතාවය, ග්‍රාමීය ගොවීන්ගේ සුබසාධනය නැංවීම යන ජාතික අභිමතාර්ථ සපුරා ගැනීම සඳහා කාර්යක්ෂම ව හා ක්‍රියාකාරී ව දායකත්වය සපයා ඇති බව අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

ආහාර සුරක්ෂිතතාවය, ග්‍රාමීය ගොවියාගේ ආර්ථිකය ඉහළ නැංවීම හා ජාතික ධනය කාර්යක්ෂම ව පරිහරණය කිරීම සඳහා මෙම වැඩපිළිවෙළ දායක වී ඇත.

නව වැඩපිළිවෙළ මගින් පොහොර භාවිතය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මට්ටමට ගෙන ඒමටත්, අමිශ්‍ර පොහොර භාවිතයට ගොවියා සම්පූර්ණයෙන් ම හුරු කිරීමටත් හැකි වී ඇත. මේ මගින් වී ඒකක අස්වැන්න ඉහළ යාම දැකිය හැක. මේ නිසා ඉහළ ගිය මුළු වී නිෂ්පාදනය රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමටත්, වී වෙනුවෙන් වැය කළ යුතු අමතර විදේශ විනිමය කාර්යක්ෂම ලෙස ඉතිරි කිරීමටත් දායක වී ඇත.

ii. නව පොහොර සහනාධාරය යටතේ වී ගොවීන් සඳහා සියලු ම පොහොර කි.ග්‍රෑ. 50 ක මිටියක් රු. 350 කට ලබා දෙන අතර, එය, 1990 පොහොර සහනාධාරය ඉවත් කිරීමෙන් පසු වාර්තා වූ අඩු ම මිල වේ. පොහොර මිල අඩුවීම මගින් වී ගොවියාගේ පොහොර සඳහා වූ පිරිවැය මුළු පිරිවැය හා සැසඳීමේ දී 11% සිට 6% දක්වා පහළ වැටී ඇත. වැඩි වූ පොහොර මිල නිසා රජයට දැරීමට සිදු වූ වියදම කෘෂිකාර්මික දළ දේශීය නිෂ්පාදිතයෙන් 3% දක්වා ඉහළ ගිය අතර, මෙය කෘෂිකර්ම හා වාරිමාර්ග සඳහා රාජ්‍ය වැය ශීර්ෂයේ 30% ලෙස වාර්තා වේ. මුළු සහනාධාරය සඳහා 2007 වර්ෂය වැය කළ බිලියන 11ක් වූ මුළු රාජ්‍ය වියදමින් 50%කට වැඩි ප්‍රමාණයක් අක්කර 3 ට අඩු වී ගොවීන් වෙත ලැබේ.

iii. වී වගාව සඳහා පොහොර බෙදා හැරීම සඳහා රාජ්‍ය අංශයේ සම්පූර්ණ මැදිහත්වීමත් සමග ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පූර්ණ වශයෙන් මෙම කාර්යයට දායක වී ඇත. රාජ්‍ය අංශය මගින් පොහොර බෙදාහැරීම නිසා ඇති වූ අනිකුත් වාසිදායක තත්ත්වයන් ද අඩු වූ බෙදා හැරීමේ පිරිවැය ද සැලකීමේ දී යම් දුර්වලතා වාර්තා වුවත් මෙම ක්‍රමය තවදුරටත් ඉදිරියට ගෙනයාම කාලෝචිත බව අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරේ.

නව පොහොර සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් ශක්තිමත් වී ඇති රාජ්‍ය ආයතනික ව්‍යුහය තවදුරටත් ශක්තිමත් කිරීමෙන් වී වගාව සඳහා වඩාත් ඵලදායී වූ ශාක පෝෂණ වැඩපිළිවෙළකට යාමට අවස්ථාව ලැබී ඇත. මෙය ඉදිරි ප්‍රතිපත්ති සම්පාදනයේ දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණකි.

## 6. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනය සහ දුප්පත්කම අඩු කිරීම සඳහා ජල ජීවී වගාව යොදා ගැනීම

කර්තෘ වෛද්‍ය කේ.එච්.ඩී.ටී. කසාගල (ශ්‍රී ලංකා පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය, පේරාදෙණිය)

**අධ්‍යයනයේ අරමුණු:**

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ, ශ්‍රී ලංකාවේ ජල ජීවී වගාව ක්ෂේත්‍රයේ තත්ත්වය සහ එය ග්‍රාමීය සංවර්ධනය සහ දුප්පත්කම අඩු කිරීම සඳහා වන උපක්‍රමයේ අනුබද්ධිත කොටසක් වශයෙන් දිරි ගැන්විය හැක්කේ කෙසේ ද? යන්න විමර්ශනය කිරීම යි. එමෙන් ම, ජාතික ආර්ථිකයට සිදු කරන දායකත්වය වර්ධනය කිරීම සඳහා එම අංශය සංවර්ධනය කිරීමේ නැඹියාවන්, අපේක්ෂාවන් විවරණය කිරීම මෙහි දී සිදු විය.

**මූලික සොයාගැනීම්**

i. ග්‍රාමීය ගෘහ ඒකකවල ආදායම් සහ ස්වයං රැකියා විවිධාංගීකරණයට ලක් කිරීමට විශේෂිත හැකියාවක් ජල ජීවී වගා වලට පවතින අතර සුළු ව්‍යවසායන් සහ විවිධාකාරයේ ගෘහ කර්මාන්ත වැනි කෘෂිකාර්මික නො වන ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා ද බොහෝ විට හැකියාව පවතී. තවදුරටත්, ග්‍රාමීය නිෂ්පාදන ක්‍රියාවලියේ අනුකලනය වූ කොටසක් වශයෙන් ද ජලජ සම්පත් ක්‍රියා කරනු ලබයි.

ii. බොහෝ සාධක අනුව ශ්‍රී ලංකාවේ ජල ජීවී වගාව සංවර්ධනය සඳහා විභවතාවන් පවතී.

පළමුවැන්න වන්නේ, නිවර්තන කලාපීය මත්ස්‍ය වර්ග, පැළෑටි වැනි විවිධ ජලජ සම්පත් ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය වන විවිධත්වයෙන් යුතු පාරිසරික තත්ත්වයන් නිරූපණය කරන විවිධ පාරිසරික කලාප සහ නානාප්‍රකාර දේශගුණික අවකාශයන්ගේ ආශිර්වාදය රටට හිමිවීම ය.

දෙවැන්න, මෝසම් වැසිවලින් ජලය ලැබෙන ජලාශ, ගංවතුර වැළැක්වීම් සිදු කරන මිරිදිය ජලාශ ඉතා විශාල සංඛ්‍යාවක්, සහ කලපු දිය පවතින විශාල භූමියක් පැවතීම ය.

තුන්වැන්න, මුතු බෙල්ලන්, මුහුදු කැකිරි, වේක්කයා (මෝදු), කොස්සා වගාවන් සඳහා මුහුදු බඩ ප්‍රදේශවල යෝග්‍ය ස්ථාන පැවතීම ය.

සිව් වැන්න, අවුරුදු ගණනාවක් තිස්සේ පුළුල් වෙමින් පවතින ඉස්සන් වගාව පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් එහි සම්පූර්ණ විභවතාව දක්වා උපක්‍රමශීලී ව සංවර්ධනය කළ හැකිවීම ය.

පස්වැන්න, ග්‍රාමීය සංවර්ධනය සඳහා ජලජ සම්පත්වල වැදගත්කම ශ්‍රී ලංකා රජය පිළිගැනීම සහ එම නිසා තාක්ෂණික දියුණුව සහ ජලජ සම්පත් සංරක්ෂණය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යි.

අවසාන වශයෙන්, ලෝකයේ ආහාර නිෂ්පාදන අංශය වේගයෙන් වර්ධනය වන හෙයින් අපනයන ආදායම් පුළුල් කිරීම සඳහා වැඩි හැකියාවක් පැවතීම පෙන්වා දිය හැක. පසුගිය දශක පහ තුළ ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් අංශයේ කැපී පෙනෙන සංවර්ධනයක් පෙන්නුම් කෙරේ.

iii. මෙම අංශයෙන් හුවා දක්වන අපේක්ෂාවන් පවතිද් දී වුව ද බොහෝ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් මගින් ප්‍රමාණාත්මක අවධානය යොමු නොවූ ග්‍රාමීය සංවර්ධනය, දුප්පත්කම අඩු කිරීම හා පෝෂණ මට්ටම වර්ධනය කිරීම ආදිය සඳහා තවදුරටත් ඉඩප්‍රස්ථා පවතී. ග්‍රාමීය සංවර්ධනය හා දුප්පත්කම අඩු කිරීම ඉලක්ක කොටගනිමින්, ජල සම්පත් අංශයේ සංවර්ධනය සඳහා පරිපූර්ණ උපාය උපක්‍රම සැලසුම් කිරීම සහ උපරිම පැවරීමක් සිදු කිරීම, පොදු දේපළ වශයෙන් නිරන්තරයෙන් භාවිතා කරන පවතින සම්පත් සම්බන්ධයෙන් වන ගැටලු අවම කිරීම සහ විසඳීම, ස්වභාවික සම්පත් සංරක්ෂණය වැනි දෘෂ්ටිකෝණ කෙරෙහි එකී උපාය උපක්‍රමවල අවධානය යොමු වීම සිදු විය යුතු ය. සම්පත් භාවිතය සම්බන්ධයෙන් වන ගැටුම් අවම කිරීම සඳහාත්, උචිත තාක්ෂණය ලබාදීම සඳහාත් ප්‍රජා සංවිධාන අවශ්‍ය ය.

**අනෙකුත් ක්‍රියාකාරකම්:**

i. කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය ඉදිරිපත් කළ තත්කාලීන වාර්තා

(අ) අනෙකුත් ක්ෂේත්‍ර භෝග, එළවළු හා පලතුරු පිළිබඳ තත්ත්ව වාර්තා

## මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් කෙටිකාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු මෙන් ම සම්මන්ත්‍රණ ද සංවිධානය කරනු ලබයි. මෙම සියලු වැඩසටහන් සඳහා සම්පත් දායකයන් වශයෙන් බොහෝ විට කටයුතු කරන්නේ ආයතනයේ පර්යේෂණ ප්‍රජාව යි. ඒ හැරුණු විට, විශේෂ අවශ්‍යතාවයන් මත විශ්ව විද්‍යාලවලින් ද, රාජ්‍ය ආයතන, රාජ්‍ය නො වන ආයතන මෙන් ම පෞද්ගලික ආයතනවලින් ද සම්පත් දායකයන් ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**අවසන් කළ පුහුණු වැඩසටහන්**

1. **ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ ප්‍රජා සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් ("ගම නැගුම" වැඩසටහන යටතේ "ගම නැගුමට සිතට සවිය" පුහුණු වැඩසටහන් මාලාව)**

**සම්බන්ධීකරණය:** ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා

රජයේ "ගම නැගුම" වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම මෙම වැඩසටහනේ පරමාර්ථය විය. ඉහත තේමාව යටතේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 2008 වසර තුළ පුහුණු වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. එහි දී එම සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණුවක් "ගම නැගුම" වැඩසටහනට සම්බන්ධ ව කටයුතු කරනු ලබන නිලධාරීන් විසින් ලබා තිබීම වැඩසටහන සාර්ථක කරගැනීමට ඉවහල් විය. මෙම පුහුණු වැඩසටහන්වලින් බලාපොරොත්තු වූයේ එම අවශ්‍යතාවය සපුරා දීම ය. පුහුණු වැඩසටහන්වල මූලික තේමාව වූයේ "ගම නැගුමට සිතට සවිය" යන්න යි. පුහුණු වැඩසටහනෙ හි මූලික පරමාර්ථය වූයේ, සහභාගිත්ව සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ සංකල්ප හා ක්‍රම විධි පිළිබඳ සහභාගිවන්නන්ගේ දැනුම වර්ධනය කිරීම යි. එයට අමතර ව ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේ දී සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය හා ව්‍යාපෘති චක්‍ර කළමනාකරණය වැනි සහභාගිත්ව ශිල්ප ක්‍රම යොදාගැනීම පිළිබඳ ව සහභාගිවන්නන්ගේ හැකියාවන් වර්ධනය කිරීම ද මෙහි දී බලාපොරොත්තු විය.

පළමු පුහුණු වැඩසටහන, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් 16 දෙනකු සඳහා 2008 මාර්තු මස 29 වැනි දින සිට අප්‍රේල් මස 02 වැනි දින දක්වා පොලොන්නරුවේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පුහුණු මධ්‍යස්ථානයේ දී පැවැත්විය. දෙවැනි පුහුණු වැඩසටහන, 2008 සැප්තැම්බර් මස 29 වැනි දින සිට ඔක්තෝම්බර් මස 03 දින දක්වා මාතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් කාර්යාලයේ දී පවත්වන ලද අතර, මේ සඳහා මාතර දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන නිලධාරීන් 32 ක් සහභාගි වූහ. මෙම පුහුණු වැඩසටහන් දෙකෙ හි ප්‍රතිඵලය වූයේ සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය උපයෝගී කරගනිමින් ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට හැකි නිලධාරීන් 48 ක් බිහිවීම ය. එයට අමතර ව ක්ෂේත්‍ර කාර්යයන් සඳහා තෝරා ගත් ගම්මාන 03 ක කෘෂිකාර්මික සංවර්ධනය සඳහා සකස් කරනු ලැබූ ආදර්ශ සැලැසුම් 03 ක් ද මෙහි දී සකස් කෙරිණි.

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ, වාරිමාර්ග කළමනාකරණ අංශය හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීම් ආයතනය අත්සන් කරන ලද ගිවිසුමකට අනුව, තවත් මෙවැනි පුහුණු වැඩසටහනක් 2008 ජනවාරි මස 17 සිට 21 දක්වා මහඉලුප්පල්ලම පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා

සංස්කරණ අභ්‍යාස ආයතනයේ දී පවත්වන ලදී. අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන් හි රාජ්‍ය නිලධාරීන් 20 දෙනෙක් මෙම පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූහ.

## 2. වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශ, වාරිමාර්ග කළමනාකරණ අංශයේ "වාරි පුබුදුව" ව්‍යාපෘතියේ සමාජ සජීවීකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන.

**සම්බන්ධීකාරක:** ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් දියත් කරන ලද "වාරි පුබුදුව" ව්‍යාපෘතිය කුරුණෑගල, අනුරාධපුර, පුත්තලම සහ මාතලේ යන දිස්ත්‍රික්කයන් හි ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතියේ විශේෂිත අරමුණක් වූ තිරසාර පැවැත්මක් ඇති ගොවි සංවිධාන ගොඩනැගීම සඳහා පවතින ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ අරමුණින් සමාජ සජීවීකරුවන් 184 දෙනකු ව්‍යාපෘතිය සඳහා අලුතින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

වාරිමාර්ග කළමනාකරණ අංශයේ අනුග්‍රහය මත "වාරි පුබුදුව" ව්‍යාපෘතියේ මෙම සමාජ සජීවීකරුවන් පුහුණු කිරීමේ කාර්යය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය වෙත පැවරිණි. මෙම පුහුණු කිරීම් ගිවිසුම් ප්‍රකාර 2007 ජූලි මස ආරම්භ විය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය සමග වාරිමාර්ග කළමනාකරණ ආයතනය අත්සන් කරන ලද ගිවිසුම්ප්‍රකාර ඉහත කී පුහුණු වැඩසටහන් 06 ක් 2008 වසර අවසන් වන විට නිම කරන ලදී. සමාජ සජීවීකරණ ක්‍රියාවලියේ දී සමාජ සජීවීකරුවන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාදීම සඳහා මෙම පුහුණු වැඩසටහන සකස් කරන ලදී. පුහුණු වැඩසටහනේ පොදු පරමාර්ථය වූයේ දැනට පවත්නා ගොවි සංවිධාන වඩාත් ශක්තිමත් කිරීම, ක්ෂේත්‍රය හා සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නො වන මෙන් ම පෞද්ගලික සංවිධාන හා ගොවි සංවිධාන අතර සබඳතාවයක් ඇති කිරීම, විවිධ ක්ෂේත්‍ර තුළින් ලබා ගත හැකි අනුග්‍රහයන් ගොවි සංවිධානය කරා ලබාගැනීමට ගොවීන් පොළඹවීම, සංවිධානය තුළ සංවර්ධනයට ඇති ගැටළු සහ අවහිරතා අඩු කිරීමට කටයුතු කිරීම හා "වාරි පුබුදුව" ව්‍යාපෘතිය සහ ගොවි සංවිධාන අතර ඇති සමීප බව වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය දැනුම, නිවැරදි ආකල්ප මෙන් ම කුසලතාවයන් ද පුහුණුවන්නන් හට ලබාදීම ය.

ඉහත සඳහන් පරමාර්ථ ඉටු කරගැනීමේ අරමුණින් දින 05 කින් යුත් පුහුණු වැඩසටහන් 02 ක් 2007 වසර තුළ පවත්වන ලද අතර, සමාජ සජීවීකරුවන් 67 දෙනෙක් ඒ සඳහා සහභාගි වූහ. 2008 වසරේ දී සමාජ සජීවීකරුවන් පුහුණු කිරීමේ ඉතිරි පුහුණු වැඩසටහන් 04 ද පවත්වා අවසන් කරන ලදී. පළමු පුහුණු වැඩසටහන අප්‍රේල් මස 21 සිට 25 දින දක්වාත්, දෙවෙනි පුහුණු වැඩසටහන සැප්තැම්බර් මස 05 දින සිට 10 දින දක්වාත්, තුන්වන පුහුණු වැඩසටහන 2008 නොවැම්බර් මස 13 දින සිට 18 දින දක්වාත්, හතරවන පුහුණු වැඩසටහන 2008 දෙසැම්බර් මස 04 දින සිට 09 දින දක්වාත්, පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් සඳහා කුරුණෑගල, අනුරාධපුර සහ මාතලේ යන දිස්ත්‍රික්කවලින් සමාජ සජීවීකරුවන් 108 දෙනෙක් සහභාගි වූහ. පුහුණු වැඩසටහන් සියල්ල ම පවත්වන ලද්දේ වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන වාරියපොළ පිහිටි වයඹ පුහුණු මධ්‍යස්ථානයේ දී ය.

මෙම පුහුණු වැඩසටහන් 04 හි ප්‍රතිඵලය වූයේ 2008 වසර තුළ අනුරාධපුරය, කුරුණෑගල, මාතලේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක "වාරි පුබුදුව" ව්‍යාපෘතිය යටතේ පුහුණු සමාජ සජීවීකරුවන් 108 දෙනෙකු පුහුණුව ලැබීම යි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, වාරිමාර්ග කළමනාකරණ අංශය සමග ඇති කර ගත් ගිවිසුමට අනුව 2008 වසර අවසන් වීමට පෙර සමාජ සජීවීකරුවන් 175 දෙනෙකු පුහුණු කර අවසන් කෙරිණි.

3. පොදුරාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලයේ අනුග්‍රහය මත පවත්වන ලද කෘෂිකාර්මික අලෙවිකරණ ව්‍යාප්ති සේවය පිළිබඳ ජාතික පුහුණු වැඩසටහන

**සම්බන්ධීකරණය:** ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා

ආචාර්ය එල්.පී.රූපසේන,

වර්තමානයේ මෙරට පවතින කෘෂි ව්‍යාප්ති සේවය වගාවන් හි අස්වැන්න වැඩි කිරීමට පමණක් නැඹුරු වූ ජාතික නිෂ්පාදනය ඉහළ දැමීමේ අරමුණින් කටයුතු කරන ලද එකක් වන අතර, අලෙවි ක්‍රමෝපායයන් සහ ගොවිපොළ සැලසුම් කෙරෙහි අවධානයක් දක්වනු නො ලබයි. මෙම තත්ත්වය යටතේ ගොවීන් විසින් වගා කරනු ලබන භෝග වර්ගවල අස්වැන්න උපරිම කරගැනීමට උත්සාහ ගනී. නමුත්, ඔවුන් තම නිෂ්පාදන සඳහා වෙළෙඳපොළක් තිබේ ද? ඉල්ලුමක් තිබේ ද? යන්න නො සිතයි. ඔවුන් වෙළෙඳපොළ ගැන සිතනුයේ නිෂ්පාදනය ලබා ගත් පසුව ය. මෙහි ප්‍රතිඵලය වන්නේ නිෂ්පාදනය වෙළඳපොළ ඉල්ලුම හා නො ගැළපීම ය. මෙම කරුණු ගැන සලකා බලන විට වෙළෙඳපොළ ඉල්ලුම හා සබැඳුණු නිෂ්පාදන, ක්‍රියාවලියක අවශ්‍යතාවයක් රට තුළ ඉස්මතු වී ඇත. මෙය ඉක්මන් අවශ්‍යතාවයක් වන අතර, රට තුළ තිරසාර කෘෂිකර්මාන්තයක් බලාපොරොත්තු විය හැක්කේ එමඟිනි. මෙම කාර්යය ඉටු කිරීම පිණිස අලෙවිකරණ ව්‍යාප්ති සේවය ද වර්තමානයේ මෙරට පවතින කෘෂි ව්‍යාප්ති සේවය හා එක් කළ යුතු වන අනිවාර්ය අංගයක් වේ.

**වැඩසටහන් හි පොදු අරමුණු**

(අ.) අලෙවිකරණ ව්‍යාප්ති සංකල්පය පිළිබඳ සහභාගීවන්නන්ගේ දැනුම වර්ධනය.

(ආ) වගා කටයුතු සැලසුම් කිරීමේ දී මෙන් ම අස්වැන්න නෙළීමෙන් පසුව ද ගොවීන් හා වෙළෙඳපොළ හිමියන් අතර අන්‍යොන්‍ය අවබෝධය හා විශ්වාසය ඇති කිරීම.

(ඇ) පෙර හෝ පසු ගිවිසුම් ඇති කර ගැනීමේ අවශ්‍යතාවය

මෙම පුහුණු වැඩසටහන පොලොන්නරුව දිස්ත්‍රික්කයේ කෘෂි ව්‍යාප්ති සේවයේ නියුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි උපදේශකවරුන් සඳහා සැලැසුම් කරන ලද්දකි. පුහුණු වැඩසටහන 2008 ජුනි 12 සිට 14 දින දක්වා පොලොන්නරුව, ගිරිතලේ පිහිටි ගිරිතලේ හෝටලයේ දී පවත්වන ලදී. පොදුරාජ්‍ය මණ්ඩලීය මහ ලේකම් කාර්යාලයේ මූල්‍ය අනුග්‍රහයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මෙම පුහුණු වැඩසටහන පවත්වන ලදී.

පුහුණු වැඩසටහනෙහි ප්‍රතිඵලය වූයේ අලෙවිකරණ ව්‍යාප්ති සේවය පිළිබඳ ව අවබෝධයකින් යුතුව කටයුතු කළ හැකි කෘෂි උපදේශකවරුන් 31 ක පිරිසක් පොලොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ බිහි කිරීම යි. මෙවැනි තවත් පුහුණු වැඩසටහන් දෙකක් 2009 වර්ෂයේ දී පැවැත්වීමට ආයතනය සැලසුම් කොට ඇති අතර, ශ්‍රී ලංකාව තුළ අලෙවිකරණ ව්‍යාප්ති සේවයක් ස්ථාපිත කිරීම මෙම පුහුණු වැඩසටහන්වල අවසාන අරමුණ වේ.

# සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය

සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය හා සම්බන්ධ තොරතුරු සැපයීමේ ජාතික මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කරයි. කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියක් ඇති කිරීම තුළින් ජාතික සංවර්ධනයට දායක වීමේ අභිප්‍රාය පෙරදැරි කොට ගෙන මෙම මධ්‍යස්ථානය 1979 වර්ෂයේ දී ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනයෙහි (USAID) සහාය ඇතිව ස්ථාපනය කරන ලදී. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ, කෘෂිකාර්මික හා ගොවි කටයුතු ආශ්‍රිත තොරතුරු රැස් කිරීම හා ඒවා පර්යේෂකයන්, සැලසුම්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, උපාධි අපේක්ෂකයන්, ගොවි මහතුන් සහ වෙනත් උනන්දුවන පුද්ගලයන් ඇතුළු විශාල පිරිසක් වෙත ලබාදීමට කටයුතු යෙදීම යි.

ඉහත සඳහන් කාර්යයන්ට අමතර ව පර්යේෂණ ව්‍යාපෘතීන් හි දත්ත විශ්ලේෂණ කටයුතු ද සිදු කරනු ලැබේ.

### ගොවිකටයුතු දත්ත බැංකුව සම්බන්ධ කටයුතු

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රවලින් රැස් කර ගන්නා දත්ත ඇසුරින්, කෘෂි භෝග, පශු සම්පත්, ජනගහනය, අලෙවිකරණය හා වෙනත් ජීව සංඛ්‍යාත්මක තොරතුරු ආශ්‍රයෙන් දත්ත පදනමක් (Database) පවත්වා ගෙන යනු ලැබේ. 2008 වර්ෂය තුළ දී පහත දැක්වෙන දත්ත මාලාවන් යාවත්කාලීන කරනු ලැබීය.

1. ආහාර ද්‍රව්‍යයන් හි සාමාන්‍ය තොග මිල
2. වී පිළිබඳ සංඛ්‍යාලේඛන (වපුරන ලද බිම් ප්‍රමාණයන්, සාමාන්‍ය අස්වැන්න හා නිෂ්පාදනය)
3. වී හැර අනෙකුත් භෝගයන් හි වගා කළ බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය
4. කෘෂි භෝගවල ආනයන හා අපනයන පිළිබඳ තොරතුරු
5. ආහාර ද්‍රව්‍යවල පරිභෝජනය පිළිබඳ දත්ත
6. පොහොර සහ කෘෂි යෙදවුම් පිළිබඳ තොරතුරු

### දත්ත සඳහා වූ ඉල්ලීම්

2008 වර්ෂය තුළ, දත්ත බැංකුව වෙත ලැබුණු මුළු ඉල්ලීම් සංඛ්‍යාව 159 කි. එයින් ඉල්ලීම් 73 ක ප්‍රමාණයක් ආයතනයේ අභ්‍යන්තර ඉල්ලීම් වන අතර, ඉතිරිය බාහිර අයගේ ඉල්ලීම් විය. එම ඉල්ලීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ගය | ඉල්ලීම් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| විශ්වවිද්‍යාල ආචාර්ය /උපාධි අපේක්ෂක/වෙනත් ශිෂ්‍ය | 22 | 25.6 |
| අමාත්‍යාංශ/රාජ්‍ය දෙපාර්තමේන්තු/අර්ධ රාජ්‍ය ආයතන | 32 | 37.2 |
| පෞද්ගලික සමාගම්/පෞද්ගලික ආයතන | 26 | 30.2 |
| වෙනත් පුද්ගල | 06 | 07.0 |
| **එකතුව** | **86** | **100.0** |

### දත්ත බැංකු කටයුතු

දත්ත බැංකුවේ කටයුතු අංශ තුනකින් කරගෙන යන ලදී. එනම්, ප්‍රධාන දත්ත පදනමට දත්ත සම්බන්ධ කිරීම්, දත්ත සත්‍යාපනය කිරීම් සහ පද්ධති නවීකරණය කිරීම් යනුවෙනි. අදාළ වර්ෂය තුළ දී දත්ත ලබාගන්නා ආකෘති පහසුවෙන් පිළියෙළ කර ගත හැකි වන සේ දත්ත ලබාගැනීමේ වැඩසටහන තවදුරටත් විකරණය කරන ලදී. සම්පූර්ණ දත්ත පදනම නිෂ්පාදන පිරිවැය, පොහොර සහ ආදායම් පිළිබඳ දත්තයන් හි නිවැරදිතාවය පිරික්සනු පිණිස පරීක්ෂා කරන ලදී. දත්තයන් හි උපයෝජ්‍යතාවය පිරික්සනු පිණිස සුචීන් ජනනය කරන ලදී.

**පර්යේෂණ ව්‍යාපෘතීන් හා දත්ත සැකසීම් කටයුතු**

වර්ෂය තුළ දී පහත සඳහන් අධ්‍යයනයන් හි විශ්ලේෂණ කටයුතු අවසන් කෙරිණි.

1. උස්බිම් ප්‍රදේශවල එළවළු වගා කිරීමේ දී සංරක්ෂණ වගා ක්‍රම භාවිත කිරීමේ ප්‍රවණතා සහ බලපෑම් පිළිබඳ අධ්‍යයනය.
2. උඩවලව ජාතික වනෝද්‍යානයේ කිරි ගව ගැළුව පිළිබඳ අධ්‍යයනය.
3. විවිධ කෘෂිකාර්මික කටයුතු සහ සමාජ කටයුතු සඳහා ජලය වෙන් කිරීමේ ගැටළු පිළිබඳ අධ්‍යයනය.
4. මතුපිට ගලායන වැසි ජලය එක් රැස් කොට කෘෂිකාර්මික කටයුතු සඳහා යොද ගැනීම පිළිබඳ අධ්‍යයනය.
5. ග්‍රාමීය ව්‍යාප්ති සේවා සැපයීමේ දී කෘ.ප.නි.ස.වරුන් වෙත ඇති සීමාවන් සහ විභවයන් පිළිබඳ අධ්‍යයනය.
6. කෘෂි භෝග විවරණය සහ කෘෂිකාර්මික පැතිකඩ.
7. දේශීය ආහාර නිෂ්පාදන වැඩසටහනේ ගෙවතු වගා ප්‍රගතිය පිළිබඳ අධ්‍යයනය.
8. ශ්‍රී ලංකාවේ ජනාවාස ව්‍යාපාරවල අවිධිමත් ඉඩම් ගනුදෙනු පිළිබඳ අධ්‍යයනය.
9. ශ්‍රී ලංකාවේ අතිරේක භෝග නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ අධ්‍යයනය.

**ආයතනයේ වෙබ් අඩවිය**

ස්ථාවර කාර්යයක් ලෙස, අලෙවි අංශයෙන් ලැබෙන්නා වූ දෛනික මිල පිළිබඳ තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කරන ලදී. ඊට අමතර වශයෙන් ආයතනයේ පර්යේෂණ ප්‍රකාශනයන් පිළිබඳ වැදගත් තොරතුරු ද ඇතුළත් කරන ලදී. වෙබ් අඩවියේ සැකැස්ම වැඩි දියුණු කිරීම සඳහා අදළ වෙනස් කිරීම් ද සිදු කරනු ලැබීය.

**වෙනත් කටයුතු**

ලිපිකරු කාර්යය මණ්ඩලයේ පරිගණක කුසලතා වර්ධනය කරනු පිණිස පාඨමාලාවක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබීය.

## පුස්තකාලය

පුස්තකාලය සතු මූලික අරමුණ වන්නේ, ආයතනයෙ හි පර්යේෂණ කාර්ය මණ්ඩලයේ මෙන් ම බාහිර පාඨකයන්ගේ සහ නියෝජිත ආයතනයන් හි ප්‍රයෝජනය පිණිස, කෘෂිකාර්මික අංශයට සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීම, ගොනු කිරීම, සමුද්ධරණය සහ තොරතුරු බෙද හැරීම යි. වර්ෂය තුළ කාර්ය මණ්ඩලය වෙත නිකුත් කර ඇති පොත් සංඛ්‍යාව 1183 ක් සහ ශාස්ත්‍රීය සඟරා 283 කි. එමෙන් ම, පුස්තකාලය පරිහරණය සඳහා පැමිණි බාහිර පාඨකයන්ගේ සංඛ්‍යාව 156 කි. පුස්තකාලයේ වර්තමාන පොත් එකතුව 21272 ක් පමණ වන අතර, සඟරා එකතුව 20,550 ක් පමණ වේ.

**ප්‍රතිග්‍රහණය කරන ලද ග්‍රන්ථ, වාර සඟරා, සිතියම් හා සංයුක්ත තැටි**

වසර තුළ පුස්තකාලය විසින් අයත් කර ගත් පොත් සහ වාර්තා සංඛ්‍යාව 259 කි. එයින් 87 ක් සෘජු මිල දී ගැනීම් වූ අතර, 100 ක් හුවමාරු පදනම මත හෝ සහයෝගීතා පදනම මත ලබා ගන්නා ලදී. දේශීය විදේශීය ආයතනවලින් පුවත් වාරික, පුවත් හසුන හා වාර්ෂික වාර්තා රාශියක් හුවමාරු පදනම මත ලැබුණි. වර්ෂය තුළ වාර මුදල් ගෙවා විදේශ වාර සඟරා 20 ක් සහ දේශීය වාර සඟරා 25 ක් ලබා ගන්නා ලදී.

**පුස්තකාල සේවා**

ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ හා බාහිර පාඨකයන්ගේ තොරතුරු හා ප්‍රලේඛන සේවාවන්, එනම් සාහිත්‍ය ගවේෂණ, විමර්ශන සේවා, කාලීන තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම් (ප්‍රවර්තන සම්ප්‍රජානනන සේවා) හා ඡායාපිටපත් සැපයීමේ සේවා සලසන ලදී. ඔවුන්ට වැදගත් වන විෂයයන් යටතේ පුවත්පත් ලිපි එකතුව පවත්වා ගෙන යන ලදී.

**අන්තර් පුස්තකාල සහයෝගීතාවය**

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) පුස්තකාලය මගින් පවත්වා ගෙන යනු ලබන ජාතික කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලි (NAB) දත්ත සංචිතය සඳහා පොත් හා සඟරා ලිපිවලට අදළ පරිගණක ගත දත්ත සපයන ලදී. කෘෂිකාර්මික දත්ත ජාලයේ (AGRINET) සාමාජික පුස්තකාල මගින් වාර සඟරා 14 ක පටුන පිටු ඡායාපිටපත් 218 ක් ද, වාර සඟරා 12 ක ඡායා පිටපත් ලිපි ද ඉල්ලුම් කරන ලද අතර, ආයතනයේ පර්යේෂණ නිලධාරීන් සඳහා වාර සඟරා 5 ක පටුන පිටු 36 ක් ඡායා පිටපත් ලෙස ලබා ගැනීම.

2008 වසර අවසාන කාර්තුවේ සිට වාර සඟරා ලිපි හා අන්තර්ගත පිටු ස්කෑන් කර, විද්‍යුත් තැපෑල මගින් අදාළ පුස්තකාල වෙත යැවීම.

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පවත්වාගෙන යන ජාතික කෘෂිකර්ම ග්‍රන්ථ නාමාවලියේ 10 වැනි වෙළුමෙ හි දත්ත පදනම සඳහා පරිගණකගත ග්‍රන්ථ නාමාවලි තොරතුරු සැපයීම.

**ප්‍රකාශන හුවමාරු වැඩසටහන**

2008 වසරේ ආයතනය නිකුත් කරන ලද ප්‍රකාශන දේශීය පුස්තකාල 4 ක් වෙත ප්‍රකාශන හුවමාරු පදනම යටතේ යවන ලදී.

## ප්‍රකාශන ඒකකය

නියෝජ්‍ය අධ්‍යක්ෂගේ (පර්යේෂණ) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ප්‍රකාශන ඒකකය මගින් පර්යේෂණ වාර්තා, කාලීන වාර්තා, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, ප්‍රචාරක පත්‍රිකා සහ වෙනත් තොරතුරු සංස්කරණය සහ භාෂා තුනෙන් ම ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබයි. ප්‍රස්තුත වසර තුළ, "අපි වවමු-රට නගමු" වැඩසටහන යටතේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සඳහා වන ප්‍රචාරක ව්‍යාපාරය සඳහා මෙම ඒකකයේ සාමාජිකයකු සහභාගී විය.

අදාළ වසර තුළ පහත සඳහන් ප්‍රකාශන එළි දැක්වීම සිදු කර ඇත.

**සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පර්යේෂණ වාර්තා:**

i. කෘෂිකර්ම පැතිකඩ - 2006 (සිංහල)
ii. Evaluation of Crop Insurance Scheme in Sri Lanka
iii. Agricultural Marketing Information Systems - Case Study in Matale District
iv. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර රටාව (සිංහල)
v. Paddy Milling Survey - 2006
vi. Food Commodities Prices 2000-2007
vii. කෘෂිභෝග විවරණය - 2005 (සිංහල)
viii. Viability of Rice Processing at Household Level
ix. Impact of the Provincial Council System on the Smallholer Agriculture in Sri Lanka
x. Recent Labour Market Trends in the Food Crop Sector in Sri Lanka
xi. An Analysis of Price Margins of Agro-Chemicals

**අනෙකුත් ප්‍රකාශන:**

i. වාර්ෂික වාර්තාව - 2006 (ඉංග්‍රීසි)
ii. වාර්ෂික වාර්තාව - 2006 (දෙමළ)
iii. ගොවි ජනතා විශේෂ කලාපය
iv. වාර්ෂික වාර්තාව - 2006 (සිංහල)
v. ගොවි ජනතා - අප්‍රේල්-ජුනි, 2008
vi. Sri Lanka Journal of Agrarian Studies, Vol.12, No. 1, 2008
vii. වාර්ෂික වාර්තාව - 2007 (ඉංග්‍රීසි)
viii. ගොවි ජනතා 2008 ජුලි-සැප්තැම්බර්

අදාළ කාලය තුළ මෙම ඒකකය පහත සඳහන් ප්‍රදර්ශන සඳහා සහභාගී විය.

i. "දැයට කිරුළ", බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, 2008 පෙබරවාරි 7-10
ii. "ගාලු සමය - 2008" ගාල්ල සමනළ ක්‍රීඩාංගණය, 2008 දෙසැම්බර් 23-27

## 2008 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය

| කාර්ය මණ්ඩලය | 2007. 12. 31 දිනට අදාළ තනතුරු | වසර තුළ දී රාජකාරී අවසන් කිරීම්, ඉල්ලා අස්වීම් | පත් කිරීම් | 2008. 12. 31 අදාළ තනතුරු |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | - | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | - | - | 01 |
| අංශ ප්‍රධානීන් | 06 | 02 | - | 04 |
| පර්යේෂණ කාර්ය මණ්ඩලය | 25 | - | - | 26 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 07 | - | - | 07 |
| පුස්තකාල ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 02 | - | - | 02 |
| දත්ත සංවර්ධන ඒකකයේ කාර්ය මණ්ඩලය | 02 | 01 | - | 01 |
| පරිගණක ඒකකය | 02 | - | - | 02 |
| ප්‍රකාශන කාර්ය මණ්ඩලය | 01 | - | - | 01 |
| සංඛ්‍යාන කාර්ය මණ්ඩලය | 21 | 01 | - | 20 |
| තාක්ෂණික කාර්ය මණ්ඩලය | 01 | - | - | 01 |
| ලිපිකාර, ලේකම් හා සමාන්තර ශ්‍රේණි | 51 | 05 | 07 | 53 |
| මෙහෙයුම් හා සම්බන්ධිත ශ්‍රේණි | 33 | 05 | 02 | 36 |
| **එකතුව** | **153** | **14** | **09** | **155** |

## කාර්ය මණ්ඩල සංවර්ධනය

### පශ්චාත් උපාධි වැඩසටහන්

පහත සඳහන් කාර්ය මණ්ඩල/පර්යේෂණ නිලධාරීන් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියැළී සිටියහ.

එන්.පී.ජී. සමන්ත මහතා - කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය 2006 දෙසැම්බර් සිට
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා - කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය 2006 දෙසැම්බර් සිට
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මහත්මිය - කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය 2006 දෙසැම්බර් සිට
කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පී.සී.ජේ. ද සිල්වා මහතා - මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (2007 සිට 2010 දක්වා) විද්‍යා හා තාක්ෂණය පිළිබඳ හුවාසොං විශ්වවිද්‍යාලය, චීනය

| | | |
|---|---|---|
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - | පරිසර විද්‍යා හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (2008 අප්‍රේල් සිට 2009 සැප්තැම්බර් දක්වා)<br>කෘෂි අධ්‍යයන පීඨය,<br>රියුකියුස් විශ්වවිද්‍යාල |
| පී.පී.පී.එස්. නානායක්කාර මෙනවිය | - | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (2008 මාර්තු සිට 2009 අප්‍රේල් දක්වා)<br>පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| එම්.පී. සන්ධ්‍යා කාන්ති මහත්මිය | - | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (2008 මාර්තු සිට 2009 අප්‍රේල් දක්වා)<br>පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| එම්.ඩී.එල්. සෙනරත් මහතා | - | තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (2008 සැප්තැම්බර් සිට 2009 අගෝස්තු දක්වා)<br>තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය,<br>මොරටුව විශ්වවිද්‍යාලය |

## ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්/දේශන/වැඩමුළු/සම්මන්ත්‍රණ/රැස්වීම් ආදිය සඳහා සහභාගීත්වය

එම්.එම්.එම්. අභියර් මහතා, සහාය අධි පර්යේෂක - 2008 ජනවාරි 06 සිට 15 දක්වා තායිලන්තයේ බැන්කොක් නුවර පැවති "ආපද කළමනාකරණයේ දී භූගෝල තොරතුරු පද්ධතියෙ හි (GIS) භාවිතයන් පිළිබඳ පුහුණු වැඩසටහන" සඳහා සහභාගී විය.

ආචාර්ය එල්.පී. රූපසේන, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) - 2008 පෙබරවාරි මස, 08 සිට 17 දක්වා, කාම්බෝජයේ, ඔක්ෆැම් අමෙරිකා නැගෙනහිර ආසියානු කලාපීය කාර්යාලයේ පැවති සහල් ප්‍රවර්ධන පද්ධති පිළිබඳ අධ්‍යයන සංචාරයට සහභාගී විය.

එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා, පර්යේෂණ නිලධාරී - 2008 පෙබරවාරි 25 සිට මාර්තු 01 දින දක්වා ඉන්දුනීසියාවේ බාලි නුවර පැවති "ප්‍රතිජනනීය ශක්තිය" පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුවට සහභාගී විය.

වී.කේ. නානායක්කාර මහතා, අධ්‍යක්ෂ - 2008 මැයි 05 සිට 07 දක්වා නේපාලයේ කත්මණ්ඩු නුවර පැවති ආසියා හා පැසිපික් කලාපය සඳහා වන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානයේ තාක්ෂණික කමිටු රැස්වීමට සහ 2008 ජූනි 23 සිට 27 දක්වා ඉන්දියාවේ දිල්ලි නුවර පැවති පාලක සභා කමිටුවට සහභාගී විය.

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා, අධි පර්යේෂක - 2008 මැයි 10 සිට 14 දක්වා පාකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර පැවැති ග්‍රාමීය සංවර්ධනය සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා සහභාගීත්ව ක්‍රමවේද පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.

සී.පී. හතුරුසිංහ මහත්මිය, අධි පර්යේෂිකා - 2008 අගෝස්තු 04 සිට 13 දක්වා ඉන්දියාවේ ගුවාහති නුවර පැවති කෘෂිකර්ම සහ ග්‍රාමීය සංවර්ධනය සැලසුම් කිරීම සහ කළමනාකරණය පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.

එම්.එක්.එන්. දමයන්ති මෙනවිය, පර්යේෂණ නිලධාරිනී - 2008 නොවැම්බර් 16 සිට 29 දක්වා මැලේසියාවේ පැවති ග්‍රාමීය ප්‍රවර්ධනය සඳහා වන ආයතනයේ (INFRA) ග්‍රාමීය පාලනය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය වැඩසටහන සඳහා සහභාගී විය.

එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මහත්මිය, පර්යේෂණ නිලධාරිනී - 2008 නොවැම්බර් 16 සිට 29 දක්වා මැලේසියාවේ පැවති ග්‍රාමීය ප්‍රවර්ධනය සඳහා වන ආයතනයේ (INFRA) ග්‍රාමීය පාලනය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය වැඩසටහන සඳහා සහභාගී විය.

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
## 2008.12.31 දිනට ශේෂ පත්‍රය

| වත්කම් | සටහන් | 2008.12.31 | | 2007.12.31 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 2 | 38,002,336.54 | | 28,934,899.47 | |
| ආයෝජන ස්ථාවර තැන්පතු | 3 | 17,534,769.99 | | 5,769,437.21 | |
| භාණ්ඩාගාර බිල්පත් | | 6,553,767.50 | | 4,372,095.10 | |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 4 | 20,272,327.22 | | 18,654,480.34 | |
| **එකතුව** | | | **82,363,201.25** | | **57,730,912.12** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 5 | 2,570,552.53 | | 3,330,316.99 | |
| ණයගැතියෝ | 6 | 28,314,669.36 | | 28,619,109.10 | |
| තැන්පතු | 7 | 612,070.00 | | 612,070.00 | |
| ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු ගිණුම් | 8 | 672,835.70 | | 424,128.35 | |
| අත්තිකාරම් | 9 | 79,041.10 | | 471,568.86 | |
| බැංකු ශේෂය | 10 | 2,751,717.76 | | 15,711,407.20 | |
| අතැති මුදල් | | 10,000.00 | | 10,000.00 | |
| | | | **35,010,886.45** | | **49,178,600.50** |
| **මුළු වත්කම්** | | | **117,374,087.70** | | **106,909,512.62** |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | | | |
| රජයේ මුලධන ප්‍රදනය | 11 | 113,341,900.00 | | 105,841,900.00 | |
| ඉතිරි කිරීම්වල දයකත්වය | | 1,102,372.79 | | 1,102,372.79 | |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දීමනා | | 2,342,835.00 | | 2,342,835.00 | |
| ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | 12 | 14,886,206.09 | | 14,886,206.09 | |
| ප්‍රාග්ධන සංචිත | | 3,242,284.40 | | 3,242,284.40 | |
| ව්‍යාපෘති පොදු සංචිත | 13 | 16,301,977.47 | | 16,524,437.47 | |
| දිරි දීමනා අරමුදල | | 137,061.91 | | 137,061.91 | |
| දිරි දීමනා අරමුදල - ව්‍යාපෘති | | 160,456.72 | | 138,210.72 | |
| පුහුණු අරමුදල - ව්‍යාපෘති | | 396,261.91 | | 396,261.91 | |
| දිරි දීමනා අරමුදල - ආයතනයේ කොටස | | 590,819.86 | | 501,835.86 | |
| ශුද්ධ ඌනතාවය ඉදිරියට ගෙන ගියා | 14 | (78,182,970.35) | | (76,599,261.14) | |
| | | | **74,319,205.80** | | **68,514,145.01** |
| **වගකීම්** | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 30,101,245.75 | | 29,618,437.52 | |
| | | | **30,101,245.75** | | **29,618,437.52** |
| **ජංගම වගකීම්** | | | | | |
| ණය හිමියෝ | 15 | 8,444,849.48 | | 6,577,298.00 | |
| උපචිත වියදම් | | 3,382,035.64 | | 2,199,632.09 | |
| බැංකු අයිරාව | | | | | |
| | | | **11,826,885.12** | | **8,776,930.09** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | **116,247,336.67** | | **106,909,512.62** |

........................................ ........................................ ........................................

සභාපති අධ්‍යක්ෂ ගණකාධිකාරිණී

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
## 2008.12.31 දිනට ආදායම් හා වියදම් ගිණුම

| | සටහන | 2008.12.31<br>රු. | 2007.12.31<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | | 96,200,000.00 | 88,900,000 |
| නේවාසිකාගාර හා සම්මන්ත්‍රණ ශාලා පහසුකම් සඳහා ලැබීම් | 16 | 5,747,748.05 | 9,093,112 |
| ප්‍රකාශන අලෙවිය | | 192,561.50 | 93,493 |
| ආයෝජන පොලිය | | 4,784,751.04 | 741,161 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | | 957,221.98 | 794,921 |
| ව්‍යාපෘති පුනරාවර්තන දායකත්වය | 17 | 2,092,118.49 | 1,706,925 |
| විවිධ ආදායම් | 18 | 1,125,416.30 | 490,132 |
| | | **111,099,817.36** | **101,819,744** |
| **වියදම** | | | |
| පරිපාලන හා ආයතන වියදම් | 19 | (103,819,651.60) | (97,108,385) |
| පර්යේෂණ හා පුහුණු කටයුතු වියදම් | | (12,486,127.18) | (4,989,110) |
| බොල් ණය උණ වෙන් කිරීම | | 1,102,636.06 | (504,581) |
| **මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම්වලින් ලත් ශුද්ධ ආදායම/වියදම** | | **(4,103,325.36)** | **(782,333)** |
| මූල්‍ය පිරිවැය | | (25,090.80) | (27,823) |
| | | | |
| **බදුවලට පෙර ශුද්ධ හිගය** | | (4,128,416.16) | (810,156) |
| බදු | | | |
| | | | |
| **බදුවලින් පසු අති විශේෂ අයිතම්වලට පෙර ශුද්ධ ආදායම** | | | |
| | | | |
| අති විශේෂ අයිතම - වාහන හා අබලි භාණ්ඩ විකිණීමෙන් ලත් ආදායම | | **2,544,706.95** | **-** |
| **ආදායම ඉක්ම වූ වියදම** | | **(1,583,709.21)** | **(810,156)** |

| ........................................ | ........................................ | ........................................ |
|---|---|---|
| සභාපති | අධ්‍යක්ෂ | ගණකාධිකාරිණී |

# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
## 2008.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | රු. | රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය**<br>වර්ෂය සඳහා ශුද්ධ හිගය | | | (1,583,709.21) |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් සඳහා | | 4,946,242.61 | |
| වාහන හා අබලි භාණ්ඩ විකිණීමෙන් ලත් ආදයම | | (2,544,706.95) | |
| ආයෝජන ආදයම | | (4,784,751.04) | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 7,012,814.94 | |
| පාරිතෝෂික ගෙවීම් | | (6,530,006.71) | (1,900,407.15) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/අලාභය** | | | **(3,484,116.36)** |
| | | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| තොග | | 759,764.46 | |
| ණය ගැතියන් | | 1,431,190.77 | |
| ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු ගිණුම් | | (248,707.35) | |
| අත්තිකාරම් | | 392,527.76 | |
| ණය හිමියන් | | 1,867,551.48 | |
| උපචිත වියදම් | | 1,182,403.55 | 5,384,730.67 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | **1,900,614.31** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | | |
| දේපල යන්ත්‍ර සහ උපකරණ මිල දී ගැනීම් | | | |
| අයෝජන ආදයම | | (14,013,679.68) | |
| කාර්ය මණ්ඩල සංවර්ධන වියදම් | | 4,784,751.04 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | (1,617,846.88) | |
| | | | **(10,846,775.52)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | | | |
| ව්‍යාපෘති පොදු සංචිත | | 7,500,000.00 | |
| දිරි දීමනා අරමුදල - ව්‍යාපෘති | | 22,246.00 | |
| දිරි දීමනා අරමුදල - ආයතනයේ කොටස | | 88,984.00 | |
| අබලි හා වාහන විකිණීමෙන් ලද මුදල | | (222,460.00) | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්** | | 2,544,706.95 | |
| | | | **9,933,476.95** |
| **මුදල් සහ මුදල් සමාන අනෙකුත් අයිතම්වල ශුද්ධ වැඩිවීම්** | | | |
| | | | **987,315.74** |
| **වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | I | | **25,862,939.51** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | II | | **26,850,255.25** |

**සටහන්**

| **මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | **1**<br>**01.01.2008** | **11**<br>**31.12.2008** |
|---|---|---|
| ආයෝජන - ස්ථාවර තැන්පතු | 5,769,437.21 | 17,534,769.99 |
| භාණ්ඩාගාර බිල්පත් | 4,372,095.10 | 6,553,767.50 |
| බැංකු ශේෂය | 15,711,407.20 | 2,751,717.76 |
| අතැති මුදල් | 10,000.00 | 10,000.00 |
| එකතුව | **25,862,939.51** | **26,850,255.25** |

## 2008 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය

| | රජය ප්‍රදානය කළ මූලධනය<br>රු. | ඉතුරුම්වල මූලධන දායකත්වය<br>රු. | අමාත්‍යාංශයෙන් ලද දායකත්වය<br>රු. | ව්‍යාපෘතියෙහි මූලධන අරමුදල්<br>රු. | මූලධන සංචිත<br>රු. | ව්‍යාපෘති පොදු සංචිත<br>රු. | දිරි දීමනා අරමුදල්<br>රු. | දිරි දීමනා අරමුදල් ව්‍යාපෘති<br>රු. | පුහුණු අරමුදල් ව්‍යාපෘති<br>රු. | දිරි දීමනා අරමුදල් ආයතනයේ කොටස<br>රු. | සමුච්ඡිත ආදයම්<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2008.01.01 දිනට ශේෂය | 105,841,900.00 | 1,102,372.79 | 2,342,835.00 | 14,886,206.09 | 3,242,284.40 | 16,524,437.47 | 137,061.91 | 138,210.72 | 396,261.91 | 501,835.86 | (76,599,261.14) | 68,514,145.01 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් | 7,500,000.00 | - | - | | - | | - | - | - | - | - | 7,500,000.00 |
| ව්‍යාපෘති දායකත්වය | - | - | - | - | - | (222,460.00) | - | 22,246.00 | - | 88,984.00 | - | (111,230.00) |
| ආදායම සහ වියදම | - | - | - | | - | | - | - | - | - | (1,583,709.21) | (1,583,709.21) |
| එකතුව | 113,341,900.00 | 1,102,372.79 | 2,342,835.00 | 14,886,206.09 | 3,242,284.40 | 16,301,977.47 | 137,061.91 | 160,456.72 | 396,261.91 | 590,819.86 | (78,182,970.35) | 74,319,205.80 |

**2008 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය**
**සඳහා මූල්‍ය ප්‍රකාශ සටහන්**

## 1. ගණකාධිකරණ ප්‍රතිපත්ති

### 1.1 පොදු

පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම හා පිළිවෙත්වලට අනුකූලව මෙහි ම හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය වන මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත.

### 1.2 වත්කම් තක්සේරුව

(i) **දේපළ, යන්ත්‍රෝපකරණ**

ශේෂ පත්‍රයෙහි දේපළ යන්ත්‍ර පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කර දක්වා ඇත. පහත සඳහන් ක්ෂය රේටයන් යටතේ, සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි | වාර්ෂික ව 2 1/2% |
| උපකරණ - ගෘහ භාණ්ඩ | වාර්ෂික ව 10% |
| පරිගණක | වාර්ෂික ව 20% |
| සුඛසාධන උපකරණ | වාර්ෂික ව 10% |
| පොත් | වාර්ෂික ව 5% |
| වාහන | වාර්ෂික ව 20% |

මිල දී ගත් වසරේ දී මුළු වර්ෂයට ක්ෂය කරනු ඇත.

ප්‍රධාන නඩත්තු හා ප්‍රධාන අලුත්වැඩියාවන් සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනික කර ඇත.

(ii) **ණයගැතියෝ**

උපලබ්ධි වේ යැයි බලාපොරොත්තු වන අගයන් වන ණය ගැතියන් දක්වා ඇත. වාර්තා කරන දිනය වන විට ශුද්ධ ණයවලින් 4% ක් ම අඩමාන ණය වෙනුවෙන් වූ ප්‍රතිපාදන සඳහා වෙන් කර තිබිණි.

(iii) **තොග**

පාරිභෝගික අවසාන තොග පිරිවැයට ගණනය කර ඇත. අනෙකුත් තොග පිරිවැය, ශුද්ධ උපලබ්ධි අගය හා ප්‍රථම ලැබීම්, ප්‍රථම නිකුත් කිරීම් යන අගයන්ගෙන් අඩු අගයට ගණනය කර ඇත.

### 1.3 පාරිතෝෂිකය

1983 අංක 2 දරණ පාරිතෝෂික පනතට අනුව, පාරිතෝෂිත ගෙවීම් සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

### 1.4 ආදයම් හා වියදම් ගණනය

වියදම ඉක්ම වූ ආදයම හෝ ආදයම ඉක්ම වූ වියදම පහත ගැලපීම් සිදු කිරීමෙන් පසු ගණනය කර ඇත.

(අ) අනාගත අසම්භාව්‍යයන් වෙනුවෙන් බොල් ණය හා අඩමාන ණය වෙන් කිරීම් සිදු කර ඇත.

(ආ) වසර තුළ දී දරන ලද වියදම් සැලකිල්ලට ගෙන ඇත.

# ක්ෂය කළ හැකි වත්කම් ලේඛනය - 2008

| විස්තරය | 2008.01.01 දිනට පිරිවැය රු. | වර්ෂයේ ජාත්‍යන්තර ගැනීම් හා ඉවත් කිරීම් රු. | 2008.12.31 දිනට මුළු පිරිවැය රු. | 2008.01.01 දිනට සමුච්ඡිත ක්ෂය රු. | 2008. වර්ෂය සඳහා ක්ෂය රු. | 2008.12.31 දිනට සමුච්ඡිත ක්ෂය රු. | 2008.12.31 දිනට ශුද්ධ අගය රු. |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 1,716,667.00 | | 1,716,667.00 | | | | 1,716,667.00 |
| ගොඩනැගිලි | 20,780,668.17 | 3,360,968.95 | 24,141,627.12 | 8,537,625.45 | 603,540.68 | 9,141,166.13 | 15,000,460.99 |
| උපකරණ / ලී බඩු | 31,692,375.30 | 2,489,417.44 | | 24,395,630.14 | 1,405,353.25 | | |
| | | (6,563,648.01) | 27,618,144.73 | | (6,563,648.01) | 19,237,335.38 | 8,380,809.35 |
| පරිඝනක හා උපාංග | 17,573,513.12 | 1,306,200.00 | | 15,317,993.76 | 1,174,973.03 | | |
| | | (2,341,867.82) | 16,718,053.58 | | (2,161,659.54) | 14,331,247.25 | 2,386,806.33 |
| මෝටර් රථ | 8,560,855.88 | 6,450,000.00 | | 8,347,206.88 | 1,343,400.00 | | |
| | | (2,341,867.82) | 12,668,988.06 | | (2,341,867.82) | 7,348,739.06 | 5,320,249.00 |
| පොත් | 9,076,311.80 | 407,103.29 | 9,483,415.09 | 3,867,096.57 | 418,975.65 | 4,286,072.22 | 5,197,342.87 |
| සුඛසාධන උපකරණ | 3,734.55 | | 3,734.55 | 3,733.55 | | 3,733.55 | 1.00 |
| මුළු එකතු කිරීම් | | 14,013,679.68 | | | 4,946,242.61 | | |
| මුළු ඉවත් කිරීම් | | (11,067,175.37) | | | (11,067,175.37) | | |
| **එකතුව** | 89,404,125.82 | 2,946,504.31 | 92,350,630.13 | 60,469,226.35 | (6,120,932.76) | 54,348,293.59 | 38,002,336.54 |

| සටහන් | 31.12.2008<br>Rs. |
|---|---|
| 3 හෙ.ගො.ප.පු.ආ. ආයෝජන - ස්ථාවර තැන්පතු | |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු | 5,500,000.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු (නිවාස ණය ක්‍රමය) | 527,219.99 |
| කෙටි කාලීන තැන්පතු | 11,507,550.00 |
| | **17,534,769.99** |
| 4. මානව සම්පත් සංවර්ධනය | |
| 2008.01.01 දිනට ශේෂය | 18,654,480.34 |
| වසර තුළ දී කරන ලද ගෙලපීම් | 1,617,846.88 |
| | **20,272,327.22** |
| 5. තොගය | |
| ප්‍රකාශන හා සඟරා | 1,074,556.24 |
| අනෙකුත් පාරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය සැපයීම් | 1,105,354.79 |
| අලෙවි සැල් (පොත් තොගය) | 390,641.50 |
| | **2,570,552.53** |
| 6. ණය ගැතියෝ | |
| **කාර්ය මණ්ඩල ණය ගැතියෝ** | |
| නිවාස ණය | 1,745,950.11 |
| ඒකාබද්ධ ණය | 21,407,547.60 |
| විශේෂ අත්තිකාරම් | 200.00 |
| උත්සව අත්තිකාරම් | 96,010.00 |
| අස්ථානගත වූ පුද්ගලයින්ගෙන් අය විය යුතු | 6,723.32 |
| වැටුප් අත්තිකාරම් | 1,363,948.48 |
| ශිෂ්‍යත්ව ලාභීන්ගේ ණය | 26,004,140.47 |
| | **50,624,519.98** |
| **වෙනත් ණය ගැතියෝ** | |
| නේවාසිකාගාර, ශ්‍රවණාගාර සහ සම්මන්ත්‍රණ ශාලා | 199,020.00 |
| ලැබිය යුතු ආයෝජන ආදායම් | 1,522,344.00 |
| විවිධ ණය ගැතියෝ | 187,881.75 |
| සේවාස්ථ පුහුණු ආයතනයෙන් ලැබිය යුතු | 6,806.38 |
| කේ.එන්.යූ. ගුණසේකරගෙන් ලැබිය යුතු | 12,100.00 |
| අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 107,302.16 |
| ඉවත් වූ සේවකයන්ගෙන් අය කර ගත යුතු | 860,032.84 |
| අලෙවි සැල් ණයගැතියෝ | 43,354.75 |
| | **2,938,841.88** |
| **ව්‍යාපෘති ඇගයීම්** | |
| ආර් - 318 ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතතාවය සහ අවදානම් | 158,669.63 |
| සහගනනාවය පිළිබඳ තොරතුරු සිතියම් ගත කිරීමේ ක්‍රමවේදය | 450,884.79 |
| ආර් - 349 කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ මධ්‍යකාලීන ඇගැයීම | **609,554.42** |
| | |
| **මුළු ගැතියෝ** | **54,172,916.28** |
| **අඩුකළා:** | |
| බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම් | (1,126,751.03) |
| ණය හිමියන් (බැදුම්කර) වෙන්කිරීම් | (110,373.69) |
| ශිෂ්‍යත්ව සඳහා වෙන් කිරීම | (25,747,873.23)<br>**27,187,918.33** |

| | |
|---|---|
| 7. **තැන්පතු** | |
| ස්ථාවර - භෝජනාගාර හිමිකරු | 20,000.00 |
| ස්ථාවර - මුදල් හිමිකරු | 1,500.00 |
| විවිධ - ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ | 147,500.00 |
| විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් (අන්තර්ජාල පහසුකම්) | 3,125.00 |
| විවිධ - තැපැල්පති | 24,945.00 |
| විවිධ - කොළඹ ගෑස් හා ජල සමාගම | 4,750.00 |
| විවිධ - ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය | 500.00 |
| විවිධ - සෙල්ටෙල් ලංකා | 3,500.00 |
| විවිධ - ලංකා විදුලිබල මණ්ඩලය | 406,250.00 |
| | **612,070.00** |
| 8. **ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු මුදල්** | |
| ඉදිරි ගෙවීම් | 672,835.70 |
| | **672,835.70** |
| 9. **අත්තිකාරම්** | |
| මිල දී ගැනීම් සඳහා අත්තිකාරම් | 11,041.00 |
| වෙනත් දේ සඳහා අත්තිකාරම් | 68,000.10 |
| | **79,041.10** |
| 10. **බැංකුවෙහි ඇති මුදල්** | |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323293 | 611,974.83 |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323292 | 1,814,746.98 |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323317 | 166,843.44 |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323315 | 158,152.51 |
| | **2,751,717.76** |
| 11. **රජයේ ප්‍රාග්ධන ප්‍රදාන** | |
| 2008.01.01 දිනට ශේෂය | 105,841,900.00 |
| වසර තුළ දී එකතු කිරීම් | 7,500,000.00 |
| | **113,341,900.00** |
| 12. **ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල** | |
| 2008.01.01 දිනට ශේෂය | 14,886,206.09 |
| වසර තුළ දී එකතු කිරීම් | - |
| | **14,886,206.09** |
| 13. **ව්‍යාපෘති පොදු සංචිතය** | |
| 2008.01.01 දිනට ශේෂය | 16,524,437.47 |
| වසර තුළ දී එකතු කිරීම් | (222,460.00) |
| | **16,301,977.47** |
| 14. **ශුද්ධ හිඟය** | |
| 2008.01.01 දිනට ශේෂය | (76,599,261.14) |
| 2008.12.31 දින දක්වා ආදයම ඉක්ම වු වියදම | (1,583,709.21) |
| | **(78,182,970.35)** |
| 15. **ණය හිමියන්** | |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 103,462.20 |
| නැවත ගෙවිය යුතු භෝජනාගාර තැන්පතු - උපතිස්ස පරණගම | 50,000.00 |
| නොගෙවු වියදම | 19,932.75 |
| ආයතනික භෝජනාගාර සැපයුම්කරු | 65,692.47 |
| ඉවත් වු සේවකයන්ට ගෙවිය යුතු | 150,015.00 |
| සේවක සහ ආපනශාලා තැන්පතු | 13,084.50 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 4,575.00 |

| | |
|---|---|
| වෛද්‍ය පහසුකම් දැරීම | 43,863.44 |
| උපතිස්ස - භෝජනාගාර සැපයුම්කරු | 25,324.46 |
| රඳවා ගත් මුදල් | 235,087.41 |
| | |
| **ව්‍යාපෘතිවල ණය හිමියෝ** | |
| සහල් නිෂ්පාදනය පිළිබඳ ග්‍රන්ථය | 1,869,952.75 |
| ආර් - 300 - සමෘද්ධි සහ සමෘද්ධි නො වන්නන් පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණය | 234,996.50 |
| ආර් - 322 - වාරියපොළ ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවාලීම සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනය සඳහා වූ යෝජනාව | 26,119.08 |
| ආර් - 324 - ගෘහස්ථ මට්ටමින් සහල් නිෂ්පාදනයේ ආර්ථිකමය ශක්‍යතාවය | 42,568.10 |
| ආර් - 332 - බස්නාහිර "පොළ" වෙළෙඳම ප්‍රවර්ධනය සඳහා වූ අධ්‍යයනය | 799,777.02 |
| ටී - 294 - එෆ්.අයි.වී.අයි.එම්.එස්. (ෆිවිම්ස්) | 217,946.87 |
| ආර් - 334 - ශක්‍යතා අධ්‍යයනය - යෝජිත බලංගොඩ ආර්ථික මධ්‍යස්ථානය | 24,048.32 |
| ආර් - 344 - සමාජ ආර්ථික සමීක්ෂණය - යෝජිත උක් වගා ව්‍යාපෘතිය | 837,706.52 |
| ටී - 228 - "ගැටුම්වලට මුහුණ දුන් ප්‍රදේශවල සංවර්ධනාත්මක ක්‍රියාමාර්ග අරඹයා වූ උපාය මාර්ග" පිළිබඳ වැඩමුළුව | 1,227,360.49 |
| ආර් - 359 - ශ්‍රී ලංකාවේ දුප්පතුන් හා හිතකර වූ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ කතිකාව | 383,737.28 |
| ආර් - 330 - ශක්‍යතා අධ්‍යයනය - යෝජිත කුරුඳුවත්ත ආර්ථික මධ්‍යස්ථානය | 163,945.94 |
| ආර් - 356 - පූර්ව ශක්‍යතා අධ්‍යයනය - යෝජිත මොණරාගල, සියඹලාණ්ඩුව උක් වගා ව්‍යාපෘතිය | 21,304.81 |
| ටී - 226 - ප්‍රජා මට්ටමේ නායකයන්ට උපදේශනාත්මක තොරතුරු පිළිබඳ අවබෝධය වර්ධනය කිරීමේ වැඩසටහන | 774,137.89 |
| ටී - 239 - කෘෂි අලෙවිකරණ ව්‍යාප්තිය පිළිබඳ දේශීය පුහුණු වැඩසටහන | 461,285.95 |
| ටී - 236 - ශ්‍රී ලංකා ජල සංවර්ධන වාර්තාව පිළිබඳ උපදේශනාත්මක වැඩමුළුව | 41,749.05 |
| ටී - 232 - පුහුණු වැඩසටහන | 607,175.68 |
| | **8,444,849.48** |
| 16. **ශ්‍රවණාගාර, සම්මන්ත්‍රණ ශාලා හා නේවාසිකාගාර අය කිරීම්** | |
| ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා අය කිරීම් | 3,679,187.30 |
| නේවාසිකාගාර අය කිරීම් | 2,068,560.75 |
| | 5,747,748.05 |
| 17. **ව්‍යාපෘති ආදායම** | |
| පරිපාලන පිරිවැය | **2,092,118.49** |
| | |
| 18. **විවිධ ආදායම්** | |
| බංගලා ගාස්තු හා කාමර කුළී | 58,696.05 |
| පැල්වෙහෙර කාමර කුළී | 23,500.00 |
| පරිගණක ආදායම | 5,801.12 |
| ටෙන්ඩර් ගාස්තු | 75,565.00 |
| වෙනත් ආදායම් | 961,854.13 |
| | **1,125,416.30** |
| 19. **පරිපාලන සහ ආයතන වියදම්** | |
| ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් | 45,937,267.02 |
| අනියම් කාර්ය මණ්ඩල වැටුප් | 4,996,690.22 |
| සේවක අර්ථසාධක අරමුදල | 7,450,263.35 |
| සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල | 1,494,635.84 |
| අතිකාල | 1,709,052.46 |
| නිවාඩු දින ගෙවීම් | 22,366.25 |
| තේ වියදම් | 361,799.00 |
| පාරිතෝෂික | 7,012,814.94 |
| ජීවන වියදම් දීමනා | 9,060,898.61 |
| දේශීය යැපීම් දීමනා | 428,813.49 |

| | |
|---|---|
| දේශීය ප්‍රවාහන දීමනා | 559,717.61 |
| විදේශීය ප්‍රවාහන දීමනා | 302,096.64 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 634,781.92 |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 1,117,786.27 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,489,611.61 |
| නිල ඇඳුම් | 121,376.20 |
| වාහන අළුත්වැඩියා | 2,059,628.50 |
| යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා | 1,070,334.83 |
| ක්ෂයවීම් | 4,946,242.61 |
| ගොඩනැගිලි අළුත්වැඩියා | 1,016,372.73 |
| දුරකථන ගාස්තු | 1,910,348.56 |
| විදුලිය | 3,095,215.45 |
| ජල බිල්පත් | 420,311.60 |
| වරිපනම් හා බදු | 197,460.00 |
| තැපැල් ගාස්තු | 509,230.00 |
| ප්‍රවාහන ගාස්තු | 245,410.78 |
| නීති උපදෙස් | 120,000.00 |
| පරිගණක උපදේශක | 108,000.00 |
| වාහන උපදේශක | 62,000.00 |
| පුවත්පත් | 215,240.00 |
| බලපත්‍ර හා රක්ෂණය | 455,053.99 |
| ආරක්ෂක ගාස්තු | 1,727,160.67 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 380,815.90 |
| රෙදි සේදීම | 218,550.00 |
| විගණන ගාස්තු | 100,000.00 |
| වෛද්‍ය රක්ෂණය | 241,703.00 |
| ආපනශාලා ගාස්තු | 107,514.85 |
| ආධාර - ප්‍රකාශන | 305,315.00 |
| විවිධ වියදම් - පර්යේෂණ | 70,000.00 |
| විවිධ වියදම් - වෙනත් | 315,732.45 |
| නෛතික ගාස්තු | 298,357.00 |
| සුබසාධන | 97,081.00 |
| දැන්වීම් | 284,538.75 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 23,114.36 |
| පාලක මණ්ඩලයට ගෙවීම් | 122,000.00 |
| මුද්‍රණ හා ප්‍රකාශන | 355,522.14 |
| විනෝදාත්මක | 41,426.00 |
| | **103,819,651.60** |
| 20. **වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන අයිතම** | |
| ආයෝජන - ස්ථාවර තැන්පතු | |
| භාණ්ඩාගාර බිල්පත් | 5,769,437.21 |
| බැංකු ශේෂ | 4,372,095.10 |
| අතැති මුදල් | 15,711,407.20 |
| | 10,000.00 |
| | **25,862,939.51** |
| 21. **වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන අයිතම** | |
| ආයෝජන - ස්ථාවර තැන්පතු | |
| භාණ්ඩාගාර බිල්පත් | 17,534,769.99 |
| බැංකු ශේෂ | 6,553,767.50 |
| අතැති මුදල් | 2,751,717.76 |
| | 10,000.00 |
| | **26,850,255.25** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / My No. : එඑජ්/ඩී/එච්ඡ්ආර්ටීඅයි/එජ්ජ්/2008

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / Date : 2009 මැයි 27 දින.

සභාපති,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය .

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ** 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2009 මාර්තු 23 දින ආයතනයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් ,යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්,අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිලිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්,මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් විය. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. 2691151

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2697451

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , **හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2008 දෙසැම්බර් 31 දිනට **හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ** ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**විවිධ වර්ෂවලදී මිලදී ගන්නා ලද 2008 දෙසැම්බර් 31 දිනටවූ පුස්තකාල පොත්වල පිරිවැය රු.9,483,415 ක් වූ අතර, එය දේපල පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනගත කර තිබිණ.මෙම පොත්වල වාර්ෂික ක්ෂය අනුපාතයද 5% ක් තරම් වූ අඩු අනුපාතයක් විය.**

#### 2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

**ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා දරන ලද රු.557,672 ක් වූ පුනරාවර්තන වියදම ප්‍රාග්ධනගත කර තිබිණ.**

#### 2.2.3 හඳුනා නොගත් ගනුදෙනු

**ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.21,573,699 ක් වූ හඳුනා නොගත් ගනුදෙනු නිරීක්ෂණය වූ අතර , ඒ පිළිබඳ වූ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණ.**

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.3,735 ක් වූ සුළු සාධක උපකරණ සහ රු. 590,570 ක් වූ තැන්පතු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2.2.5 නීති,රීති,රෙගුලාසි සහ කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවුණු අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | විස්තර |
|---|---|
| (අ).1971 අංක 38 දරන මුදල් පනතේ 13 (8) වගන්තිය | මුදල් පනතේ 13 (7) (ඊ) වගන්තිය ප්‍රකාර 2007 වර්ෂයට අදාලව නිකුත් කරන ලද වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ හෝ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග විගණකාධිපති වෙත වාර්තා කර නොතිබිණ. |
| (ආ).2001 පෙබරවාරි 06 දිනැති අංක 393 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ආයතනයට අයත් වාහනයක් බාහිර පාර්ශවයන්ට මුදා හැර තිබිණ. |
| (ඇ).මුදල් රෙගුලාසි | |
| (i). මු.රෙ.380 | රාජ්‍ය ආයතනයක් බැංකු ගිණුම් එකකට වැඩි ගණනක් රාජකාරි ගිණුම් ලෙස පවත්වන විට ඒ සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත්, ආයතනයේ බැංකු ගිණුම් 04 ක් නඩත්තු කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබිණ. |

(ii). අංක 756

2008 වර්ෂය සඳහා පුස්තකාල පොත් සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර , එම වත්කම් සත්‍යාපන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබිණ.

**2.2.6 ලැබිය යුතු ගිණුම්**

-------------------

ශිෂ්‍යත්වලාභී ණයගැතියන් ලෙස ගිණුමෙහි දැක්වෙන වටිනාකම රු.26,004,140 ක් වන අතර , ඉන් රු.12,723,162 ක් වූ ණයගැතියන් වර්ෂ 4 ක් ඉක්මවා තිබුණි. එසේම මෙම ණයගැතියන් තුල ණයගැතියන් 4 දෙනෙකුගෙන් වර්ෂ 10 කට අධික කාලයක සිට අයවිය යුතු වටිනාකම රු.6,445,628 ක් විය.ඉතිරි ණයගැතියන්ගෙන් වර්ෂ 4 කට අධික කාලයක සිට අයවීම් හිඟ හිට ඇති වටිනාකම රු.1,728,831 ක් විය.

**2.2.7 ගෙවිය යුතු ගිණුම්**

--------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයහිමි වටිනාකම තුල වර්ෂ 4 කට අධික කාලයක් තුල නිරවුල් නොකරන ලද ව්‍යාපෘති ණයහිමි වටිනාකම රු.1,869,953 ක් ද, වර්ෂ 2 කට අධික කාලයක් තුල නිරවුල් නොකල , ඉල්ලා අස්වූ සේවකයන්ට ගෙවිය යුතු රු.150,015 ක් ද ඇතුලත් විය.

(ආ) ණයහිමි ශේෂය තුල 2003 වර්ෂයට ඉහත කාලසීමාවක සිට පැවතෙන සේවක සහ ආපනශාලා තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.13,084 ක් විය.

**2.2.8 කළමණාකරන අකාර්යක්ෂමතා**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශයෙන් දෙන ලද දැනට භාවිතයේ පවතින මෝටර් රථ 05 ක් ආයතනයේ නමට ලියාපදිංචිකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ පියවර කිසිවක් ගෙන නොතිබිණ.

(ආ) ණය මුදල් නොගෙවා සේවකයන් ආයතනය හැරයාම නිසා එකතුව රු.441,181 ක මුදලක් ආයතනයට අයකර ගැනීමට නොහැකි වී තිබිණ.

## 3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු.97,783,709 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.89,710,156 ක් විය. රු.96,200,000 ක් වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසුව, සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.1,583,709 දක්වා අඩු විය. රු.88,900,000 ක් වූ ඉකුත් වර්ෂයේ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.810,156 දක්වා අඩු වූ හෙයින් , සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.773,553 ක ඌනතාවයේ වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 3.2 කාර්ය සාධනය

පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධ දත්ත පහත වගුවේ දැක්වේ.

| | 2008 වර්ෂය | 2007 වර්ෂය |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ සංඛ්‍යාව | 18 | 15 |
| එකතු කළා | | |
| වර්ෂය තුල ප්‍රදානය කළ සංඛ්‍යාව | 11 | 06 |
| | 29 | 21 |
| අඩු කළා | | |
| වර්ෂය තුල නිම කළ සංඛ්‍යාව | 12 | 03 |
| වර්ෂය අවසානයට නොනිම් වැඩ සංඛ්‍යාව | 17 | 18 |

2008 වර්ෂය අවසානයට නොනිම් ව්‍යාපෘති 17 අතරින් 08 ක් 2008 දෙසැම්බර් 31 දිනට නිමකල යුතු වුවත් , එසේ නිමකර නොතිබුණු අතර, 2009 මාර්තු මාසය වන විට එකී ව්‍යාපෘති 08 න් 06 ක කටයුතු නිමකර තිබිණ.එක් ව්‍යාපෘතියක් ප්‍රතිපාදන නොලැබීම මත නතර කර තිබුණු අතර, "රසායනික පොහොර භාවිතයෙන් තොර ගොවිතැන" නම් වූ ව්‍යාපෘතියේ කටයුතු 2009 මාර්තු මාසය වන විටත් නිම කර නොතිබිණ.

3.3 **අරමුණට පරිබාහිරව යෙදවීම**

---

පර්යේෂණ සහ ආර්ථික සහයෝගීතාවය සඳහා වූ ස්වීඩන් නියෝජිතායතනයෙන් 1992 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතියකට එක්සත් ජනපද ඩොලර් 65,000 ක් ලැබී තිබිණ.පාලක මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා ව්‍යාපෘතිය අනුමත නොවූ බවත් 2006 වර්ෂයේදී එම මුදල් යොදාගෙන "කුඩා ඉඩම් වගා අංශයේ පරිණාමය සහ වර්තමාන තත්ත්වය" පිළිබඳ අධ්‍යයනයක් කර පොතක් ප්‍රකාශනය කිරීමේ ව්‍යාපෘතියකට මෙම මුදල් යොදාගෙන ඇති බවත් සභාපතිවරයා විසින් 2009 අප්‍රේල් 03 දින මා වෙත වාර්තා කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ අපේක්ෂිත අරමුණ සඳහා මුදල් යොදවාගෙන නොමැති බවත් 2009 මාර්තු 30 දින වන විටද එකී ව්‍යාපෘතිය අවසන් කර නොමැති බවත්ය.

3.4 **නිශ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්**

---

වටිනාකම රු.120,000 ක් වූ යතුරු පැදි 02 ක් වර්ෂ 09 ක කාලයක සිටද , වටිනාකම රු.40,000 ක් වූ යතුරු පැදියක් වර්ෂ 11 ක කාලයක සිටද , වටිනාකම රු.240,000 ක් වූ යතුරු පැදි 03 ක් වසරකට වැඩි කාලයක සිටද , භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවැති බැව් නිරීක්ෂණය විය.

3.5 **අයවැය ලේඛන පාලනය**

---

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

04. **පද්ධති සහ පාලන**

---

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ). අත්තිකාරම් ලබාදීම සහ නිරවුල් කිරීම
(ආ). පිටස්තර ආයතනවල ස්ථාවර වත්කම් පරිහරණය

එස්.ස්වර්ණජෝති
විගණකාධිපති.